අධ්‍යාපන අමාත්‍යාංශය | கல்வி அமைச்சு | Ministry of Education
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් අංශය
திறன் அபிவிருத்தி, தொழிற்சார் கல்வி, ஆராய்ச்சி மற்றும் புதிய கண்டுபிடிப்புக்கள பிரிவு
Skills Development, Vocational Education, Research & Innovation Division



2023

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
இலங்கை தொழிற்பயிற்சி அதிகாரசபை
Vocational Training Authority of Sri Lanka

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

වාර්ෂික වාර්තාව

2023



ආයතනය - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

අමාත්‍යාංශය - අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන,
වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය

ලිපිනය - "නිපුණතා පියස",
නො. 354/2,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

ඊ මේල් ලිපිනය - info@vtasl.gov.lk

වෙබ් අඩවිය - www.vtasl.gov.lk

විගණකවරු - විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන් - මහජන බැංකුව

පටුන

දැක්ම හා මෙහෙවර	7
අධිකාරියේ කාර්යභාරය	8
පිළිගැන්වීම	9
හැඳින්වීම හා ව්‍යුහය	10
අධ්‍යක්ෂ මණ්ඩලය	10 - 11
මෙහෙයුම් කාර්යභාරය	12 - 13
2023 විශේෂිත කාර්යයන්	14 - 15
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	16
2023 වසරේ ජයග්‍රහණයන්	16 - 17
වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා නව තාක්ෂණය යොදා ගැනීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා ගිවිසුම්ගත වීම.	18 - 21
2024 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක	22 - 23
සාමූහික යහපාලන වාර්තාව	24
සාමූහික සමාජ වගකීම	24
තිරසාර සංවර්ධනය	24
ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය මණ්ඩලය	25 - 27
කාර්යය මණ්ඩල සංයුතිය	28 - 30
පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම	31 - 36
කාර්යය මණ්ඩලයේ දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම	36
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය	37 - 39
වෘත්තීය පුහුණු පරීක්ෂණ පැවැත්වීම හා ඇගයීම්	40
වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය	41
කර්මාන්ත සබඳතා හා රැකියාගත කිරීම්	42 - 45
රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්	46
ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	47
අභියෝග	47
විගණන කමිටු කාර්ය සාධනය	48 - 49
මූල්‍ය ප්‍රකාශන වාර්තාව	50 - 85
මූල්‍ය විග්‍රහය 2013 - 2023	86
විගණකාධිපති වාර්තාව	87 - 94
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු වාර්තාව	95 - 97



දැක්ම

ගෝලීය රැකියා
නිපුණත්වය ලබා දීම
තුලින් උසස් ජීවන
තත්ත්වයක් ඇති කිරීම.



මෙහෙවර

ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම
ක්‍රියාශීලි සහ නිර්මාණශීලි,
වෘත්තීය අධ්‍යාපනය,
පුහුණුව සහ
සේවා සපයන්නා බවට
පත්වීම.

අධිකාරියේ කාර්යභාරය

01 වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම හා රැකියා ගතවීම සඳහා අවශ්‍ය දක්ෂතා ලබාගත හැකිවන පරිදි සුදුසුකම් ඇති තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුවක් ඍජුව හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ නියෝජිත ආයතනයක් මගින් ලබාදීම.

02 ජාතික වෘත්තීය පරීක්ෂණ, විභාග පැවැත්වීම සහ වෘත්තීය පුහුණුව ලබා ඇති ආධුනිකයන්ට සහතික සහ වෙනත් ප්‍රධාන නිකුත් කිරීම.

03 වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ පැවත්වීම හා වෘත්තීය පුහුණුව සංවර්ධනය කිරීම.

04 වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල නිසි ප්‍රමිති පවත්වාගෙන යාම සඳහා එම මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම.

05 අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා සපයන ලද පහසුකම් සහ උපකරණ වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අයකිරීම් නියම කිරීම සහ අය කිරීම.

06 අධිකාරියේ කටයුතු සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම, කුලියට ගැනීම හෝ බැහැර කිරීම.

07 අධිකාරියේ කර්තව්‍යය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළුම ගිවිසුම් වලට එලඹීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

08 අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා තෝරා ගනු ලැබූ ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සේවායෝජකයින් සමග ගිවිසුම් වලට එලඹීම.

09 අධිකාරියේ ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබා දීමට අදහස් කරනු ලබන සෑම සේවායෝජකයෙකුම එම පුහුණුවට ප්‍රථම ආධුනිකයා සමඟ ගිවිසුමකට එලඹිය යුතු බවට සහ එම ගිවිසුම අධිකාරිය වෙත ලියාපදිංචි කරන බවට වග බලා ගැනීම.

10 වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශන ලබාදීම.

පිළිගැන්වීම

ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා,
අධ්‍යාපන අමාත්‍ය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමණි,

වාර්ෂික වාර්තාව - 2023
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ 25 වන වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) C වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට,
විශ්වාසී,



එස්. කේ. රාජපක්ෂ,
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

හැඳින්වීම හා ව්‍යුහය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 1995 අගෝස්තු 16 වන දින ස්ථාපිත කරන ලදී. එවකට කම්කරු දෙපාර්තමේන්තුව යටතේ වූ මිනිස්බල අංශය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට පවරා "ජීවිතයට හැකියාවක් - හැකියාවට රැකියාවක්" යන තේමාව යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීමේ ප්‍රධාන අභිප්‍රාය වූයේ රටේ ග්‍රාමීය තරුණ තරුණියන් වෙත ළඟා වී දේශීය හා ජාත්‍යන්තර වශයෙන් රැකියා අවස්ථා සඳහා යොමු විය හැකි ශිල්පීය හැකියාවන් ලබා දීම වේ.

ව්‍යවස්ථාපිත ආයතනයක් වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වර්තමානයේ පුහුණු ක්ෂේත්‍ර 18 ක් ඔස්සේ දිවයින පුරා ව්‍යාප්තව ඇති පුහුණු මධ්‍යස්ථාන 204 ක් තුලින් වෘත්තීය පුහුණු අවශ්‍යතා සපුරාලනු ලැබේ. ගෝලීය ශ්‍රම බලකායට නිපුණතාලත් තරුණ තරුණියන් බිහි කිරීම තුලින් ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් සලසනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය (2023.03.09 සිට 2023.12.31 දක්වා)

- **එයාර් වයිස් මාර්ෂල් ප්‍රසන්න රණසිංහ (විශ්‍රාමික)**
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **චතුර ද සිල්වා මහතා**
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **එච්. ඩබ්. කේ. අතාවුදගේ මිය**
  අතිරේක ලේකම්
  නිපුණතා සංවර්ධන අංශය

- **එස්. ඒ. මහින්ද ලාල් ගුණතිලක මහතා**
  අතිරේක ලේකම් (කර්මාන්ත සංවර්ධන)
  කර්මාන්ත අමාත්‍යාංශය

- **ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා**
  කම්කරු කොමසාරිස් ජනරාල්
  කම්කරු දෙපාර්තමේන්තුව

- **ජේ. ඒ. ඩී. රොෂාන් මහතා**
  අධ්‍යක්ෂ (යෞවන කටයුතු)
  ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

- **චන්න ප්‍රසාත් සුබසිංහ මහතා**
  අධ්‍යක්ෂ
  ජාතික ආධුනිකත්ව හා කාර්මික
  පුහුණු කිරීමේ අධිකාරිය

- **ටී. ඩී. රසිකා ප්‍රබෝධනී මිය**
  නියෝජ්‍ය අධ්‍යක්ෂ
  මුදල් අමාත්‍යාංශය

- **එස්. පී. ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා**
  හිටපු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ
  ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම

- **විරාජ් හර්ෂණ පෙරේරා මහතා**
  කළමනාකරණ අධ්‍යක්ෂ
  රිලයන්ස් කැපිටල් පුද්ගලික සමාගම

- **එස්. කේ. රාජපක්ෂ මහතා**
  සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
  කොස්මික් තාක්ෂණ සමූහය

- **නොයෙල් ජෝෂප් මහතා**
  කළමනාකරණ අධ්‍යක්ෂ
  ප්‍රොපිටර් ඔෆ් චෙන් ජේ කන්සල්ටන්

අධ්‍යක්ෂ මණ්ඩලය (2022.10.09 සිට 2023.03.08 දක්වා)

- **ඒ. ටී. උපාලි කැප්පිටිපොල මහතා**
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **රුවිනි ධර්මසිරි මෙනවිය**
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **රුචික අමරසේකර මහතා**
  සභාපති
  ජාතික ආධුනිකත්ව හා කාර්මික
  පුහුණු කිරීම් අධිකාරිය

- **ආර්. ඒ. එල්. උදය කුමාර මහතා**
  අධ්‍යක්ෂ
  රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව

- **කේ. පී. මූණගම මහතා**
  අධ්‍යක්ෂ (තාක්ෂණික)
  අධ්‍යාපන අමාත්‍යාංශය

- **ජේ. එම්. සනත් බණ්ඩාර ජයසුන්දර මහතා**
  Consultant and Corporate Sectretaries පුද්ගලික සමාගම

2023 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 15 ක් පවත්වා ඇත.

මෙහෙයුම් කාර්යභාරය

සැලසුම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය

ආයතනික මෙහෙයුම් කාර්යය සඳහා දායකත්වය සපයන අංශයකි. ආයතනික දැක්ම, මෙහෙවර සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය දිගුකාලීන සහ කෙටිකාලීන සැලසුම් සකස් කිරීම සහ ප්‍රගතිය විශ්ලේෂණය කරමින් නව පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය පියවරයන් සැලසුම් කිරීම හා වෘත්තීය පුහුණුවට අදාල විවිධ පර්යේෂණයන්, සිද්ධි අධ්‍යනයන් සිදු කිරීමද නව ව්‍යාපෘති වාර්තාවන් සකස් කිරීම සහ අධීක්ෂණය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. අංශයට අනුයුක්තව ඇති තොරතුරු කළමනාකරණ පද්ධතිය (MIS) කළමනාකරණය කිරීම මඟින් ආයතනික සංවර්ධනය සඳහා අවශ්‍ය දත්ත විශ්ලේෂනයන් සැපයීමද සිදු කරනු ලබයි.

වෘත්තීය මාර්ගෝපදේශන හා ප්‍රවර්ධන අංශය

දිවයින පුරා ස්ථානගතව සිටින වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් මඟින් වෘත්තීය පුහුණුවට අදාල ප්‍රාදේශීය, දිස්ත්‍රික්, ජාතික මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු සිදු කිරීමත් පුහුණුව සඳහා තරුණ තරුණියන් බඳවා ගැනීම, වැඩිදුර පුහුණුව සහ රැකියා අවස්ථා සඳහා යොමු කිරීම මෙහි ප්‍රධාන කාර්යභාරය වේ.

පුහුණු අංශය

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ මෙහෙයුම් ක්‍රියාවලියේ ප්‍රමුඛතම අංශය වන අතර දිවයින පුරා ස්ථාපිත පුහුණු මධ්‍යස්ථාන මඟින් සිදුවන පුහුණු කාර්යභාරය නවීකරණය කරමින් පුහුණු කාර්යය කළමනාකරණය කරනු ලැබේ. මෙම අංශය යටතේ දිස්ත්‍රික් අධ්‍යයනය කාර්ය මණ්ඩලයද ඇතුලත්ව සෘජුව පුහුණුව සඳහා දායක වන අධ්‍යනය කාර්ය මණ්ඩලයද 1098 කි.

පරීක්ෂණ සහ ඇගයීම් අංශය

පරීක්ෂණ සහ ඇගයීම් කටයුතු කිරීම පිළිබඳව අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සකස් කිරීම, අදාල උපදේශකවරුන්/ විභාග පරීක්ෂකවරුන්/ කාර්ය මණ්ඩලය පුහුණු කරමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල පවත්වන NVQ, Non NVQ පාඨමාලා සඳහා පෙර ඇගයීම් සහ අවසන් ඇගයීම් සැලසුම් කිරීම, පැවැත්වීම, නියාමනය සහ අධීක්ෂණය කිරීමේ කටයුතු මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

පාලන අංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවාවන් සඳහා අවශ්‍ය භෞතික සහ මානව සම්පත් කළමනාකරණය පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර අධිකාරිය සතු රු. බිලියන 7 ක් පමණ වටිනාකමින් යුත් භෞතික සම්පත් පවත්වාගෙන යමින්, යටිතල පහසුකම් කළමනාකරණය මෙම අංශය මගින් ඉටු කරයි. දිස්ත්‍රික් අනධ්‍යයන කාර්යය මණ්ඩලයද ඇතුලත්ව 562 ක අනධ්‍යයන කාර්යය මණ්ඩලයක් මෙම අංශය යටතේ සේවය කරනු ලබයි.

ගිණුම් අංශය

රජයේ පිළිගත් මූල්‍ය ප්‍රතිපත්තීන්ට අනුව වාර්ෂික මූල්‍ය ඇස්තමේන්තු සහ අවසන් ගිණුම් ප්‍රකාශන පිළියෙල කරමින් ආයතනයේ සියලුම මූල්‍ය කටයුතු හැසිරවීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

අභ්‍යන්තර විගණන අංශය

ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමට හා ඒ හා වන මෙහෙයුම් කාර්යයට උපදේශාත්මකව නිවැරදි දිශානතියක් පෙන්වීමට ස්වාධීනව ක්‍රියා කරන අංශයකි. එමඟින් ආයතනයේ ඵලදායිත්වය වැඩි දියුණු කිරීමට දායකත්වය ලබා දේ.

2023 විශේෂිත කාර්යයන්

➢ රාජ්‍ය අංශයේ වෘත්තීය හා ශිල්පීය පුහුණුව සපයන ආයතනයන් අතුරින් 31% කට අධික තරුණ තරුණියන් පිරිසකට වෘත්තීය පුහුණුව සපයන ආයතනය බවට පත් වීම.



NVQ CERTIFICATES ISSUED AS AT 2024-01-04

Institute	Level 1	Level 2	Level 3	Level 4	Level 5	Level 6	SUB Total
NAITA	438	13809	104926	57094	0	0	176267
DTET	99	4058	33551	35989	9985	1274	84956
NYSC	57	3009	11448	14722	7	0	29243
VTA	2428	18170	122339	84723	1803	17	229480
Private & Other	25521	11778	127988	46419	3681	4615	220002
TOTAL	28543	50824	400252	238947	15476	5906	739948

➢ ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව වෙනුවෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා වූ ඉලක්ක ඇතුලත් 2023 -2027 වසර සඳහා වූ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම.





➢ විදේශ සේවා නියුක්ති කාර්යංශය සමඟ එක් වී පුහුණුවලත් ශ්‍රමිකයින්ගේ නිපුණතාවය ඇගයීමට ලක් කර සහතික නිකුත් කිරීමේ නිල පරීක්ෂණ ආයතනය බවට පත් වීම.



➢ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 22,635 කුත් (NVQ) නොවන සහතික 4,139 කුත් පෙර දැනුම ඇගයීම (RPL) යටතේ සහතික 3,487 කුත් වශයෙන් සහතික 30,261 ක් නිකුත් කිරීම.





➢ කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව විශේෂ අවශ්‍යතා ඇති (ඔටිසම්) දරුවන්ට ද ඔවුන්ගේ ඉදිරි ජීවන අවස්ථාවක් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු තාක්ෂණ පුහුණු පාඨමාලාවක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික පියවර ගැනීම.





➢ දේශීය, විදේශීය රැකියා ඉලක්ක කර ගනිමින් දේශීය ආයතන 40 ක් සහ විදේශීය ආයතන 20 ක ගේ සහභාගිත්වයෙන් 2023.12.12 දින නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනයේදී රැකියා පොළක් (VTA Global Job Fair) පැවැත්වීම. ඒ සඳහා 1022 ක තරුණ තරුණියන් පිරිසක් සහභාගි විය.





අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ 1995 අගෝස්තු මස 16 වන දින ස්ථාපිත කරනු ලැබූ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 2023 වර්ෂයේ දී ද ජාතික වෘත්තීය පුහුණු ආයතන 08 ක්, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ප්‍රාදේශීයව ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 174 කින් සමන්විත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 204 ක මධ්‍යස්ථාන ජාලයක් ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාවේ තරුණ තරුණයින් හට වෘත්තීය දැනුම, ආකල්ප හා ශිල්පීය හැකියාවන් ලබා දුණි. ඒ සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් 1695 ක් පූර්ණකාලීනවද 444 අර්ධකාලීනවද පවත්වා යෞවන යෞවනියන් 39236 ක් පුහුණුව සඳහා බඳවා ගනු ලැබීය.

2023 වසරේ කාර්යයසාධනය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලය 2733 කි. ඉන් 67% ක ප්‍රමාණයක් අධ්‍යනය කාර්යය මණ්ඩලයට අයත් උපදේශක කාර්යය මණ්ඩලය වේ. 2023 වර්ෂයේ උපදේශක කාර්යය මණ්ඩලයෙන් 174 ක හිඟයක් පැවතිණි. එවැනි තත්ත්වයක් මත හා මෙහෙයුම් ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා වෙන් ව තිබූ රු. මිලි. 650 ක වෙනත් පුනරාවර්තන ප්‍රතිපාදන වලින් 29% ක ප්‍රමාණයක් පමණක් මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන ලෙස ලැබිණි.

එවන් මූල්‍ය හා භෞතික ගැටලු පැවතිය ද 2023 වර්ෂයේ රු. මිලි. 357 ක ආදායමක් ඉපයීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට හැකියාවක් ලැබිණි.

2023 වර්ෂයේ දී පහත කාර්යයසාධනයන්ද අත්කර ගැනීමට සමත් විය.

1. 2023 වර්ෂයේ දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 204 ක දී පූර්ණකාලීනව හා අර්ධකාලීනව වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන් පිළිවෙලින් 30151 ක් හා 9085 ක් වශයෙන් 39236 ක් බඳවා ගැනීමට කටයුතු කිරීම.

2. 2023 වසර ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට විශේෂිත වූ අභියෝගාත්මක වසරකි.වසර 9 ක කාලයකට පසු පොදු ව්‍යාපාර කාරක සභාව වෙත පෙනී සිටීම හා එමඟින් ඉතා කෙටි කාලයක් තුල ජාතික ආර්ථික සංවර්ධන සැලසුම් හා අනුගත වන උපායමාර්ගික අරමුණු ඇතුලත් සංයුක්ත සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කිරීමට නියම වූ අතර ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව වෙනුවෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා වූ ඉලක්ක ඇතුලත් 2023 - 2027 වසර සඳහා වූ සංයුක්ත සැලැස්ම සකස් කිරීම.

3. පුහුණුවලත් ශ්‍රමිකයින් විදේශ රැකියා අවස්ථා සඳහා යොමු කිරීමේ අරමුණින් විභව රැකියා අවස්ථාවන් හඳුනා ගෙන ඒ සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා හඳුන්වාදීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ වසර 05 ක කාලසීමාවක් සඳහා ගිවිසුම් අත්සන් කිරීම හා එමඟින් සෞදි අරාබිය, දකුණු කොරියාව (E7), ඕශ්‍රායලය, රුමේනියාව, සිංගප්පූරුව වැනි රැකියා අවස්ථා බහුල රටවල් සඳහා යොමු වන ශ්‍රමිකයින් නිපුණතාවය ඇගයීමට ලක් කර සහතික නිකුත් කිරීමේ නිල පරීක්ෂණ ආයතනය බවට පත්වීම.

4. වත්මන් ආර්ථික අවපාතය යටතේ විදේශ රැකියා අපේක්ෂිතයින් ඉලක්කගත කරමින් වෘත්තීය විෂය ක්ෂේත්‍ර 7 ක් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් 44 ක් ආරම්භ කිරීම හා දෛනික පූර්ණකාලීන පාඨමාලාවන්ට බාධාවක් නොවන පරිදි ඉගැන්වීමේ කාලය පෙ.ව. 7.30 ට ආරම්භ කර දිනකට පාඨමාලා 3 ක් පැවැත්වීම සඳහා ධාරිතාවය වැඩි කිරීමට කටයුතු කිරීම හා සති අන්ත පාඨමාලා ආරම්භ කිරීම තුලින් පුහුණු ධාරිතාවය 150% කින් ඉහළ නැංවීම.

5. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 22,635 කුත් (NVQ) නොවන සහතික 4,139 කුත්, පෙර දැනුම ඇගයීම (RPL) යටතේ සහතික 3,487 කුත් වශයෙන් සහතික 30,261 ක් නිකුත් කිරීම.

6. රාජ්‍ය ප්‍රතිපත්ති අනුව සැමට වෘත්තීය අධ්‍යාපනය හා තාක්ෂණය හඳුන්වා දීමේ වැඩපිළිවෙල යටතේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජ්‍යායතනයේ ප්‍රධානත්වයෙන් අ.පොස. (සාමාන්‍ය පෙළ) හා අ.පොස. (උසස් පෙළ) අවසන් වූ සිසුන්ට තොරතුරු තාක්ෂණ ජාතික වෘත්තීය සුදුසුකම් 3 - පැය 300 කෙටිකාලීන පාඨමාලා හඳුන්වා දීමට අවශ්‍ය මූලික පියවර ගැනීම.

7. Career Platform Project – Korea වැඩසටහන් යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ Career Platform ව්‍යාපෘතිය සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් තෝරා ගනිමින් අපගේ ආයතනයේ අත්දැකීම හා පලපුරුද්දට අදාල දත්ත කොරියානු ව්‍යාපෘතිය සමඟ හුවමාරු කරගනිමින් එම මෘදුකාංගය සකස් කිරීමට අදාල සහය ලබා දීම සහ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 4069 ක් පවත්වා පාසල් සිසුන්, පාසල් හැරගිය සිසුන්, දෙමාපියන්, ගුරුවරුන් ඇතුලු 188485 ක් දැනුවත් කිරීම.

8. වෘත්තීය පුහුණු අධිකාරියේ සේවාවන් සමාජගත කිරීම හා වෘත්තීය පුහුණු සන්නාමය ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් ප්‍රදර්ශන සඳහා සහභාගි වීම. උදා: Skills Expo - 2023, GIOCAL FAIR - 2023, Edufirst Expo - 2023, AFTEX 23.

9. පුහුණුව අවසන් කල පුහුණුලාභීන්ගේ සාර්ථක ජීවන වෘත්තාන්ත (Success Stories) 25 ක් වීඩියෝගත කර සමාජමාධ්‍ය ජාලා වල ප්‍රචාරණය කිරීම හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සඳහා නිකුත් කිරීම.

10. දකුණු කොරියානු රජයේ ආනයන අපනයන බැංකු (EXIM Bank) හා මානව සම්පත් සංවර්ධන වැඩසටහන (HRD Korea) ආධාර යටතේ පිළිවෙලින් ඩොලර් මිලියන 1.5 හා ඩොලර් මිලියන 1.61 ක නවීන පුහුණු උපකරණ සහ ආශ්‍රිත පුහුණු පහසුකම් ඔරුගොඩවත්ත හා නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතන වෙත ලබා ගැනීමේ ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම. එමගින් මෙම ආයතනය තුල පාඨමාලා කොරියානු ප්‍රමිතියට අනුව ක්‍රියාත්මක කර රජයේ නිලලත් ඇගයීම් හා භාෂා මධ්‍යස්ථාන බවට පත් කිරීම.

11. S4IG ව්‍යාපෘති ආධාර යටතේ පොලොන්නරුව-කඳුරුවෙල හා ගාල්ල-අහංගම වෘත්තීය සූපවේදී පාඨමාලා සඳහා පුහුණු උපකරණ සහිත අංග සම්පූර්ණ මුලුතැන් ගේ 2 ක් (Kitchen) සිසු අයිතියට පැවරීම හා එමඟින් පුහුණු ධාරිතාවය වැඩි කර ගැනීමට හැකිවීම හා සූපවේදී විෂය මාලාව සංවර්ධනය හා උපදේශකවරුන් ඒ අනුව පුහුණු කිරීම.

12. කර්මාන්තයේ ප්‍රමුඛයන් හා එක්ව විශේෂිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
Lanka Tiles, Keells, David Peris Motors, Ideal Motors, Asian Paints, Akzonobel

13. Pizza Hut අනුග්‍රහයෙන් Quick Service Restaurant Crew Members (QSR) NVQ Level 4 පාඨමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් පුහුණු මධ්‍යස්ථාන 14 න් නාරාහේන්පිට, ඔරුගොඩවත්ත සහ යාපනය මධ්‍යස්ථාන 03 සංවර්ධනය කර සිසු අයිතියට පැවරීම හා එමඟින් පුහුණු ධාරිතාවය වැඩි කර ගැනීමට හැකිවීම. මෙම ආධුනිකයින් හට ජාත්‍යන්තරව පිළිගත් රැකියා අවස්ථාවන් හිමිවීම.

14. ඩිජිටල් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ රූපවාහිනී නාලිකාව (V TV- Youtube) මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලා 05 ක් සඳහා Vedio Clips 61 ක් නිෂ්පාදනය කිරීම.

15. ජල සම්පාදන අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ජලනල කාර්මික පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම සහ නිලධාරීන් 50 දෙනෙකු පුහුණු කිරීම.

16. අ.පො.ස.(සා.පෙල) හා උසස් පෙළ සිසුන් ඉලක්ක කරමින් කොළඹ හා තදාසන්න පාසල් 12 ක නව වෘත්තීය ප්‍රභවයන් හඳුනා ගෙන ගැලපෙන වෘත්තීන් වල මූලික දැනුම සහ ශිල්පීය පුහුණුව ලබා දීම සඳහා සිසු සමාජ (STEAM CLUB) කොමර්ෂල් බැංකුවේ අනුග්‍රහය මත ස්ථාපිත කිරීම.

වෘත්තීය පුහුණු පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා නව තාක්ෂණය යොදාගැනීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා ගිවිසුම්ගත වීම.

- **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය :** විදෙස් රැකියා පුරප්පාඩු පවතින රැකියාවන් සඳහා අවශ්‍ය පාඨමාලාවන් හඳුනාගනිමින් පුහුණු පාඨමාලා හා අදාල ඇගයීම් කටයුතු සිදු කිරීම. පාඨමාලා 17, පුහුණු වැඩසටහන් 75 ක පුහුණුලාභීන් 1504 ක් මේ වන විට ප්‍රතිලාභ ලබා ඇත.

- **Causeway Paints Lanka (Pvt) Ltd :** ඔරුගොඩවත්ත මධ්‍යස්ථානයේදි උපදේශක පුහුණු වැඩසටහන් හා ආධුනික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ Auto Painter උපදේශකවරුන් 8 දෙනෙකු පුහුණු කිරීම. තවද, 2024 වර්ෂයේදි පින්තාරු ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා පුහුණු ද්‍රව්‍ය නොමිලේ ලබාදීමට කටයුතු කෙරේ.

- **Akzonobel Paints Lanka (Pvt) Ltd :** පින්තාරු ක්ෂේත්‍රයේ උපදේශක පුහුණු වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කර ඇති අතර උපදේශකවරු 61 දෙනෙකු පුහුණු කිරීම.

- **Ministry of Women, Child Affairs and Social Empowerment :** අවු. 18 - 30 ත් අතර ඉලක්කගත කාන්තාවන් 80 ක් සඳහා Bakery, Cookery and Beauty පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කිරීම.

- **Pizza Hut ආයතනය :** තෝරාගත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 14ක Quick service restaurant crew member (QSR) NVQ Level 4 පාඨමාලාව ක්‍රියාත්මක කිරීම සහ තෝරාගත් මධ්‍යස්ථාන නවීකරණය කිරීම. ඔරුගොඩවත්ත හා නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනයන්හි සිසුන් 19 දෙනෙකු ද, නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ සිසුන් 15 දෙනෙකුද, කරෙයිනගර් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ සිසුන් 20 දෙනෙකුත් මේ වන විට පුහුණුව ලබමින් සිටී.

- **Swisstec and Alumex ආයතනය :** තෝරා ගත් දිස්ත්‍රික්ක 12 ක ක්‍රියාත්මක වෙමින් පවතින පාඨමාලා 12 ක් සඳහා අවශ්‍ය වන ඇලුමිනියම් පුහුණු ද්‍රව්‍ය ලබාදීම සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. සහභාගිවන්නන් 223 ක් ඇතුලත් පුහුණු වැඩසටහන් 6 ක් පැවැත්වීම.

- **පීපල්ස් ලීසිං ආයතනය :** මෝටර් රථ කාර්මික ශිල්පී පාඨමාලා සිසුන් සඳහා කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම සහ එමගින් සිසුන් 35 දෙනෙකු පුහුණු කිරීම.

- **බෙලෝස් ලංකා ආයතනය :** කොණ්ඩා සැකසුම් ශිල්පී ආධුනිකයින් සඳහා කුසලතා සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම සහ එමඟින් සිසුන් 80 දෙනෙකු පුහුණු කිරීම.

උපායමාර්ගික සැලැසුම් සකස් කිරීමේ වැඩමුළුව



විදේශ සේවා නියුක්ති කාර්යංශය සමඟ ගිවිසුම්ගත වීම



Skills Expo 2023 ප්‍රදර්ශනය



HRD Korea ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වීම



S4IG අහංගම් සහ කඳුරුවේල Kitchen Opening



Pizza Hut QSR crew member වැඩසටහන



අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්



විදේශ සේවා නියුක්ති කාර්යංශය සමඟ ගිවිසුම්ගත වීම



AkzoNobel Paints ආයතනය සමඟ ගිවිසුම්ගත වීම



Asian Paints Causeway ආයතනය සමඟ ගිවිසුම්ගත වීම



Swisstec Aluminium ආයතනය සමඟ ගිවිසුම්ගත වීම

2024 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශයේ උප අංශයක් ලෙස නිපුණතා සංවර්ධන හා වෘත්තිය අධ්‍යාපනය හඳුන්වා දිය හැක. ඒ අනුව එම අංශයේ පවත්නා තත්ත්වයට සාපේක්ෂව වඩාත් වැඩි ප්‍රවණතාවයකින් ඉහළ නැංවීමක් සිදු කිරීම කල යුතුව ඇත.ඒ සඳහා රාජ්‍ය අංශයේ ප්‍රමුඛ වෘත්තීය පුහුණුව සපන්නා වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට සැලකිය යුතු මට්ටමේ සමාජ මෙහෙවරක් ඉටු කිරීමට 2024 වර්ෂය තුලදී සිදු වනු ඇත. ගෝලීය රැකියා ඉල්ලුමට සරිලන නිපුණ හා තරඟකාරී ශ්‍රම බලකායක් බිහි කිරීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 2024 වර්ෂය කටයුතු කරනු ඇත.

1. වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර 18 ක් යටතේ ජාතික ශ්‍රම බලකායට උචිත කුසලතා පූර්ණ තරුණ පරපුරක් දායාද කිරීමේ අරමුණින් දිවයින පුරා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 4069 ක් පැවැත්වීම මඟින් පිලිවෙලින් පූර්ණකාලීනව හා අර්ධකාලීනව 31,580 ක් හා 10,285 ක් ලෙස ආධුනිකයින් 41,865 දෙනෙකු පුහුණු කිරීම. ඊට අමතරව නම්‍යශීලි ඉගෙනුම් හා මිශ්‍ර ක්‍රමවේද අනුගමනය කරමින් තරුණ ඉල්ලුමට සරිලන කෙටිකාලීන පුහුණු වැඩසටහන් දියත් කිරීමට සැලසුම් කෙරේ.

2.. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යංශය පිළිබඳ රාජ්‍ය විගණන් සමාලෝචන වාර්තාව මඟින් දක්වා ඇති නිර්දේශයන්ට අනුගත වෙමින් 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන සියලු පාඨමාලා සඳහා ඇතුලත් වන ආධුනිකයින්ට ශිෂ්‍යත්ව ක්‍රමවේදයක් ද හඳුන්වා දෙමින් පාඨමාලා ගාස්තු අය කිරීමට කටයුතු කරනු ඇත. එමඟින් භාණ්ඩාගාර මුදල් මත යැපීම අවම කර ආදායම් උත්පාදනය කිරීමට කටයුතු කරනු ඇත.

3. විධිමත් ඇගයීම් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ඇගයීම් 27,000 ක් සහ NVQ නොවන ඇගයීම් 4,600 ක් ද RPL 4000 ක් වශයෙන් ඇගයීම් පැවැත්වීමට කටයුතු කිරීම හා ඊශ්‍රාලයේ පවත්නා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ 50000 කට අධික රැකියා අවස්ථාවන් ඇති Tiller, Barbender, Plastering, Brick layer, Form work සඳහා යොමු වන්නන් RPL ක්‍රමවේදය මඟින් සහතිකකරණයට ලක්කිරීම.

4. සෑම දිස්ත්‍රික්කයක්ම කේන්ද්‍ර කරමින් උපායමාර්ගික ව්‍යාපාර ඒකක පිහිටුවීමට කටයුතු කිරීම හා ව්‍යවසායකත්ව නිපුණත්වය ලද ආධුනිකයින් ව්‍යවසායකයින් බවට පත්කිරීමේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 50 ක් පැවැත්වීම සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුල නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීම හා කර්මාන්ත ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණින් කර්මාන්තහිමියන් දැනුවත් කිරීමේ වැඩමුලු 43 ක් පැවැත්වීම.

5. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූලික පරමාර්ථයන් අතරින් එක් පරමාර්ථයක් වන සෑම පුහුණුලාභියෙක් සඳහාම රැකියා අවස්ථාවක් සහතික කිරීමේ මූලික පරමාර්ථය මත රාජ්‍ය හා පෞද්ගලික සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමට කටයුතු කරනු ඇත. එමඟින් එම අංශයන් හා එක්ව ශිල්පීය දක්ෂතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් 38 ක් පැවැත්වීම හා රැකියා වෙළඳපොල පැවැත්වීම මඟින් පිළිවෙලින් දේශීය, විදේශීය හා ස්වයං රැකියා අවස්ථාවන් සහතිකපත්ලාභීන්ගෙන් අවම වශයෙන් 60% ක ප්‍රමාණයක් යොමු කිරීම.

6. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන ක්‍රමවේදයන්ට අනුගත වෙමින් හා පුහුණු පරිසරය හා පුහුණු පාඨමාලා පිළිබඳව අවබෝධයක් ලබා දීම අරමුණු කර ගනිමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි පාසැල් සිසුන් සඳහා විවෘත දිනයන් දහයක් (Open days) පැවැත්වීමට සැලසුම් කිරීම.

7. වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන් පෙළඹවීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුව ලබා සාර්ථක වූ දේශීය හා විදේශීය වශයෙන් රැකියාගතවූවන් සහ ව්‍යවසායකයින් පාදක කර ගනිමින් Success Story 25 ක් නිර්මාණය කිරීම.

8. විදේශ රැකියා ඉලක්ක ගත අරමුණින් තෝරා ගත් පාඨමාලාවන්හි විෂයමාලා සංවර්ධනය කිරීමට කටයුතු කර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන ප්‍රතිතන මට්ටම් ලබා ගැනීම හා නව පාඨමාලා හඳුන්වා දීම හා ICT Level V පාඨමාලාවේ විෂය නිර්දේශ කර්මාන්ත ක්ෂේත්‍රයට ගැළපෙන පරිදි යාවත්කාලීන කර ක්‍රියාත්මක කිරීම.

9. කම්කරු අමාත්‍යංශය හා ඒකාබද්ධව ජාතික හා ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපල වෙත යොමු වී ඇති සේවා නියුක්තිකයින් ඉලක්ක කර ගනිමින් තානාපති කාර්යාල, සේවායෝජකයින් හා එක්ව පෙර දැනුම් ඇගයීම් (RPL) සහතිකපත්‍ර කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කර ඔවුනට සේවා වටිනාකමක් හා ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට අවශ්‍ය සහය ලබා දීම. ඊට අමතරව දිවයින පුරා පෙර දැනුම් ඇගයීම් (RPL) මධ්‍යස්ථාන 25 ක් ආරම්භ කිරීමට සැලසුම් කිරීම.

10. පුහුණුව ලබන ආධුනිකයින් හා පුහුණුකරුවන් ඒකාබද්ධව නවෝත්පාදන ඒකක ස්ථාපිත කිරීමේ වැඩපිළිවෙල යටතේ නවෝපාදන ඒකක 05 ක් ස්ථාපිත කිරීම.

11. කර්මාන්තගත ශ්‍රමිකයිනගේ වෘත්තීය හැකියා පරතරය අවම කිරීම සඳහා පුහුණු වැඩසටහන් 10 ක් පැවැත්වීමට කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුකරුවන් 400 ක් සඳහා කර්මාන්තගත පුහුණු අවස්ථා සැලසීම සහ කාර්යය මණ්ඩල සංවර්ධනය යටතේ අධ්‍යයන හා අනධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් 43 ක් ක්‍රියාත්මක කිරීම.

12. පුහුණුව ලබන ආධුනිකයින් ඇතුලත් කරමින් දිස්ත්‍රික් මට්ටමින් "ව්‍යවසායකත්ව සමාජ" (ED CLUB) බිහි කිරීම මඟින් වෘත්තීය පුහුණුලාභීන් ව්‍යවසායකයින් බවට පත්වීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම ලබා දීම.

13. (PPP) වෘත්තීය පුහුණුවේ සංවර්ධනය උදෙසා 2024 වර්ෂයේ ද රාජ්‍ය හා පෞද්ගලික සහයෝගීත්වය යටතේ ගිවිසුම්ගත වීමට නියමිතය.

- ❖ Insight Interior EDMUN (IIEM)
- ❖ WSK Business Services (PVT) Ltd
- ❖ South Asia Gateway Terminals (SAGT)
- ❖ GK GLOBAL
- ❖ VIDATHA (Industrial Ministry)
- ❖ International Vocational Training Collage (PVT) LTD
- ❖ National Youth Crops Sri Lanka
- ❖ Ideal Motors (PVT) LTD
- ❖ Steam ED Global (PVT) LTD

ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව වෙනුවෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා වූ ඉලක්කගත අරමුණු ඇතුලත් උපායමාර්ගික සැලැස්මට අනුගත වීමෙන් වඩාත් ඵලදායී සමාජ මෙහෙවරක් උදෙසා කඩිනම් සැලසුම් සකස් කිරීම මඟින් මනා වැඩසටහන් හා ඉලක්ක කරා යාමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය උත්සුක වනු ඇත.



වියාර් වයිස් මාර්ෂල් ප්‍රසන්න රණසිංහ (විශ්‍රාමික)
USP, MHR, MSc (Def Stu) in Mgt, MSc (Mil Stu), MSc (NSWS - Pak),
LLM, LLB, ndc, psc, Z
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

සාමූහික යහපාලන වාර්තාව

1995 අංක 12 දරණ වෘත්තීය පුහුණු අධිකාරී පනතින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මේ වන විට දිවයින පුරා විහිදි පැතිරී ගිය ශාඛා ජාලයකින් සමන්විත වූ ආයතනයක් බවට පත්ව ඇත.

ආයතනය සතුව ඇති මනා සංවිධාන ව්‍යුහය තුලින් ආයතනික පරමාර්ථයන්ට ප්‍රමුඛස්ථානය දෙමින් වඩාත් විනිවිදභාවයෙන් යුත් ප්‍රතිපත්තීන් අනුගමනය කරමින් රට මුහුණ පා ඇති ආර්ථික අවපාත තත්ත්වයන්ට අවැසි ක්‍රමවේද අනුගමනය කරන ජාතික වෘත්තිය පුහුණු ආයතන 08 ක්, දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ප්‍රාදේශීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 174 ක් වශයෙන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 204 ක මධ්‍යස්ථාන ජාලයක් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

අප විසින් 2023 - 2027 වර්ෂයන් සඳහා සකස් කරන ලද උපායමාර්ගික සැලැස්මට අනුව ඉදිරි වර්ෂ කීහිපය සඳහා වඩාත් සාර්ථක ඉලක්ක වලට ලඟා විය හැකි පරිදි සෑම දිස්ත්‍රික්කයකම උපායමාර්ගික ව්‍යාපාර ඒකක පිහිටුවා එමඟින් උපයන ආදායම් තුලින් පුහුණු මධ්‍යස්ථානයන්හි මෙහෙයුම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.එමෙන්ම මූල්‍යය තිරසරභාවය ඵලදායිව මැන බැලීම සඳහා ක්‍රමවේදයන් හදුන්වා දීමට නියමිතය.

සාමූහික සමාජ වගකීම

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය විවිධ මට්ටමින් පාසල් අධ්‍යාපනය අවසන් කරනු ලැබූ තරුණ තරුණියන් දහස් ගණනක් වෘත්තීය අධ්‍යාපනයට යොමු කරමින් ඔවුනට රැකියා සුරක්ෂිතභාවය ඇති කර ගැනීමට මංපෙත් සලසන ආයතනයකි. මේ සඳහා විවිධ උපාය උපක්‍රමික වැඩසටහන් ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ සඳහා ඒ ඒ දිස්ත්‍රික් මට්ටමින් සන්නද්ධ වූ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයක් වඩා කාර්යක්ෂම හා ඵලදායි ලෙස සේවයට යොදවා ඇත. විශේෂයෙන් තරුණ තරුණියන්ගේ වෘත්තිය ලැදියාවන් හඳුනාගැනීමට කටයුතු කරමින් සුදුසු පාඨමාලාවන් වෙත ඔවුන් යොමු කිරීමට මාර්ගෝපදේශන ලබා දීමේ සුවිශේෂී වැඩපිළිවෙලක් ආයතනය මනා වගකීමකින් ඉටු කරනු ලබයි.

එමෙන්ම තරුණ තරුණියන් ඒකරාශි කර ගනිමින් ඔවුන්ගේ මෘදු කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ලේ දන් දීමේ වැඩසටහන්, රෝහල් නඩත්තු කටයුතු හා වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථානයන්හි ශ්‍රමදාන වැඩසටහන් දියත් කර ඔවුන්ව දිරිමත් කරනු ලබයි. තවද විශේෂ අවශ්‍යතා ඇති දරුවන් වෙනුවෙන් තොරතුරු තාක්ෂණය හා ආහාර පාන සේවය යන පාඨමාලා ආරම්භ කොට ඔවුන්ගේ අනාගත සුරක්ෂිතභාවය ඇති කිරීමට අවශ්‍ය මං පෙත් විවර කිරීමටද ශ්‍රී ලංකා වෘත්තීය පුහණු අධිකාරිය කටයුතු කර ඇත.

තිරසර සංවර්ධනය

වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන විවිධ ආයතන අතරින් ඉතාමත් ශක්තිමත්ව සිය මෙහෙවර දිවයින පුරා ප්‍රචලිතව දියත් කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පත්ව ඇත. ඒ සඳහා කැප වූ දක්ෂ කාර්යය මණ්ඩලයකින් හා මූල්‍යය ශක්තිමත්භාවයකින් කටයුතු කරනු ලැබේ.

ඒ අනුව හෙට දින රට මුහුණ දී ඇති මූල්‍යය අර්බුදයට විසදුම් සෙවීම සඳහා විවිධ ක්ෂේත්‍ර යටතේ වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව නිම කල තරුණ තරුණියන්ට ගෝලීය රැකියා වෙළඳපලට යොමු වීමට අවශ්‍ය මඟපෙන්වීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් සිදු කරනු ලැබේ. ඒ සඳහා දේශීය ව්‍යවසායකයින්, මෙන්ම විදේශ රැකියා අවස්ථාවන්ට යොමු වීම වෙනුවෙන් විදේශ රැකියා නියුක්ති කාර්යංශය හා එක්ව විශාල මෙහෙවරක් දියත් කර ඇත.

ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය මණ්ඩලය

සභාපති

එයාර් වයිස් මාර්ෂල් ප්‍රසන්න රණසිංහ (විශ්‍රාමික) - 2023.03.09 දින සිට

ඒ. ටී. උපාලි කැප්පිටිපොල මහතා - 2022.10.06 සිට 2023.03.08

උප සභාපති

චතුර ද සිල්වා මහතා - 2023.03.17 දින සිට

රුවිනි ධර්මසිරි මෙනවිය - 2022.10.06 දින සිට 2023.03.16

අධ්‍යක්ෂ ජනරාල්

මේජර් ජනරාල් ප්‍රියන්ත වීරසිංහ :විශ්‍රාමික* - 2023.10.30 දින සිට

එච්. චූලාංගනී පෙරේරා මිය - 2023.05.21 විශ්‍රාම ලබා ගන්නා ලදී.

අධ්‍යක්ෂවරු

1. **එස්.එම්. එදිරිසිංහ මිය (පුහුණු)**
2. **ජී.වී.පී. නිරෝෂන පෙරේරා මහතා** (මානව සම්පත් හා පරිපාලන - 2023.01.01 සිට 2023.01.11 දක්වා වැඩ බැලීම) (පරීක්ෂණ හා ඇගයීම් - 2023.01.12 දින සිට)
3. **ජේ. ඒ.ඩී. එස්.නිශාමනී මිය** (මුදල්) (2019.12.19 සිට වැඩ බැලීම)
4. **ඒ.එම්.ටී. එස්.ආටිගල මහතා** (මානව සම්පත් හා පරිපාලන) - 2023.01.13 දින සිට රාජකාරී ඉටු කිරීම
5. **ජී.එච්.පී. දමයන්ති මිය** (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන) - 2022.05.26 සිට රාජකාරී ඉටු කිරීම.
6. **ඊ.ඒ.ඩී.එස් සේනාරත්න මහතා** (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියාගත කිරීම් හා ප්‍රවර්ධන) - 2023.01.10 දින සිට රාජකාරී ඉටු කිරීම.
7. **සී.ජේ. විද්‍යානපතිරණ මහතා** (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියාගත කිරීම් හා ප්‍රවර්ධන) - 2021.09.29 සිට 2023.01.10 දින දක්වා රාජකාරී ඉටු කිරීම.

ප්‍රධාන අභ්‍යන්තර විගණක

1. විල්.එන්.පී.එස්. කුමාර මහතා - 2023.10.26 සිට රාජකාරී ඉටු කිරීම
2. ජේ.එම්.පී. සිරිවර්ධන මිය - 2022.03.02 දින සිට 2023.06.15 දක්වා වැඩ බැලීම

නියෝජ්‍ය අධ්‍යක්ෂවරු

1. එච්.ඩබ්. රොහාන් ප්‍රියන්ත මහතා (2023.12.08 දින සිට විශ්‍රාම)
2. වී. කනගසුන්දරම් මහතා
3. ටී. විනෝදරාජා මහතා
4. පී.එන්. අබේසිංහ මහතා
5. ඩී.ඒ.එස්. අතුකෝරල මහතා
6. බී.එච්.ඒ. නෙල්සන් මහතා (2023.04.25 දින දක්වා)
7. එච්.ඒ.පී. ගුණවර්ධන මහතා
8. එම්.ජී.ජී. සමන් මහතා (2023-06.30 දින දක්වා)
9. ආර්. සුනිල් මහතා
10. එම්.කේ.බී. ජයතිලක මහතා
11. වී.ජී. නිමල්සිරි මහතා
12. එස්. මැද්දේගොඩ මහතා
13. එම්.බී. නලීම් මහතා
14. ආර්. පතිරගේ මිය.
15. ඒ.ඒ. ජබීර් මහතා
16. සී.පේ. විද්‍යානපතිරණ මහතා
17. කේ.ඩී.එන්. ද සිල්වා මහතා
18. පී.පේ. ජයවර්ධන මිය
19. ඩබ්ලිව්.එම්.ඒ.එස්.එල්. විජේනායක මිය

සහකාර අධ්‍යක්ෂවරු

1. රාධ ක්‍රිෂ්ණන් මධුරතන් මහතා
2. කේ. නිරංජන් මහතා
3. ඒ.ඒ.ඩබ්.ජී.ආර්.ආර්. බණ්ඩාර මහතා (ශ්‍රී ලංකා නාවික හමුදාවට තාවකාලිකව නිදහස් කර ඇත)
4. පී.ජී. ප්‍රසන්න මහතා
5. එච්. එදිරිසිංහ මිය
6. ඒ.ඒ.ඩී.ටී. ශාන්ත මහතා
7. ටී.වී.ඩබ්. දේවප්‍රිය මහතා
8. යූ.ජී.පේ.ප්‍රියදර්ශන මහතා
9. ආර්.ඩී. ප්‍රදීපිකා මිය
10. ඊ.පේ. විජේතුංග මහතා
11. එච්.එල්. සිසිර මහතා
12. ඩබ්ලිව්.කේ. සුමිත් වසන්ත මහතා
13. ආර්. අහිලන් මහතා
14. තිළිණ රණසිංහ මහතා
15. ජී.ඩී. ශ්‍යාමලී මිය
16. සී. ඩී. සමරනායක මහතා
17. සී.යූ.එම්. කොඩිතුවක්කු මිය
18. සුනිල් අබේසිංහ මහතා
19. ජී.කේ.ඩී.සී. කුමාර මහතා
20. එස්.එම්.පේ. සුවේන්ද්‍ර මහතා
21. එස්.එම්.එම්.කේ. සියමුදලි මිය
22. එන්.කේ. අඹගහවත්ත මිය
23. ඩී.සී.ඕ. විතාන මිය
24. ඒ.ඩී.එස්. සමරසිංහ මහතා
25. ඒ.පී. ජගත් නිශාන්ත මහතා
26. එල්.පී.කේ.ඩබ්ලිව්. වැලිවත්ත මහතා
27. ඩී.එම්. යහම්පත් මහතා
28. කේ.පී.ඩී.පී. සිරිසේන මහතා
29. එන්.ඒ.ඒ.ඩී. නාගහවත්ත මහතා
30. එම්.එම්.එන්.බී. මධුරසිංහ මහතා
31. එන්.ඩී.ඩී. එදිරිසිංහ මිය
32. එන්.ටී. දළුවත්ත මිය (2023.07.31 දින ඉල්ලා අස්වී වී ඇත.)
33. කේ.එස්.ජී.එස්. ගුණසේකර මහතා
34. එම්.ඩී.ඒ.එම්. අමරසිංහ මිය
35. ටී.එම්.ඒ. තෙන්නකෝන් මහතා
36. අයි.යූ .වික්‍රමනායක මිය
37. එච්.ඒ.ඩී.ආර්. ජයරත්න මහතා
38. එච්.ඩබ්.ආර්.එස්. ජයවර්ධන මහතා
39. ඒ.කේ. ජයවර්ධන මිය
40. එන්.ජී.ඩී.අයි. ගුණරත්න මහතා
41. කේ.ඩබ්. රංජිත් ලාල් මහතා
42. එස්.එම්.එස්.බී. සමරකෝන් මහතා
43. එස්.ඒ.ඒ.එස්. අතුකෝරල මහතා
44. කේ.ජී. භාතිය අමරනාථ මහතා
45. අයි.එම්.එන්. දිසානායක මහතා
46. බී.ජී.ඩී.කේ. කාරියවසම් මිය
47. කේ.කේ. සෝගීස්මන් මහතා
48. පී.එන්. රණවීර මහතා
49. කේ. අභිඥාදනා මිය

නීති නිලධාරී

50. ඩි.ඒ.එස්. ආලෝකා ද සිල්වා මිය

කාර්යය මණ්ඩල සංයුතිය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2023.12.31 දිනට ඒ ඒ තනතුරු මට්ටමින් 1660 දෙනෙකු සේවයේ යෙදී සිටි ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ 2023 වර්ෂය සඳහා අනුමත කාර්යය මණ්ඩලය 2733 කි.

	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය	වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය	සේවා කාණ්ඩය
01	අධ්‍යක්ෂ ජනරාල්	1	1	-	HM 2-1
02	අධ්‍යක්ෂ	6	1	5	HM1-1
03	ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	-	1	
04	විදුහල්පති	1	-	1	MM 1-3
05	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	85	67	18	MM 1-1
06	සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන	1	1	-	
07	සහකාර අධ්‍යක්ෂ - අධ්‍යයන	3	-	3	
08	සහකාර අධ්‍යක්ෂ - කාර්මික	1	-	1	
09	සහකාර ලේඛකාධිකාරී	1	-	1	
10	නීති නිළධාරී	1	1	-	
11	අභ්‍යන්තර විගණක	1	-	1	
12	ඉංජිනේරු	1	-	1	
13	පරිපාලන නිළධාරී	3	2	1	JM 1-1
14	පරීක්ෂණ හා ඇගයීම් නිළධාරී	13	6	7	
15	විමර්ශන නිළධාරී	1	1	-	
16	ප්‍රවාහන නිළධාරී	1	-	1	
17	සැපයුම් නිළධාරී	1	1	-	
18	මුද්‍රණ නිළධාරී	1	-	1	
19	අභ්‍යන්තර විගණන නිළධාරී	3	3	-	
20	පද්ධති විශ්ලේෂක	1	-	1	
21	සුභසාධක නිළධාරී	1	1	-	
22	ගිණුම් නිළධාරී	33	26	7	
23	ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිළධාරී	10	9	1	


24	පුහුණු නිළධාරී	98	45	53	
25	පර්යේෂණ නිළධාරී	2	1	1	
26	සැළසුම් නිළධාරී	2	1	1	
27	සභාපති සඳහා වූ පෞද්ගලික සහකාර	1	-	1	
28	පෞද්ගලික සහකාර*	7	4	-	
29	භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)	1	-	1	MA 5-2
30	භාෂා පරිවර්තක (සිංහල/දෙමළ)	3	-	3	
31	ජ්‍යෙෂ්ඨ උපදේශක	201	108	93	
32	වැඩසටහන් නිළධාරී	70	54	16	MA 4
33	විගණන සහකාර*	3	-	-	
34	සහකාර පුස්තකාලාධිපති	1	-	1	MA 3
35	ව්‍යාපෘති සහකාර*	34	7	-	
36	තාක්ෂණික සහකාර	3	1	2	
37	උපදේශක	1614	945	669	MA 2-2
38	ක්‍රීඩා උපදේශක	31	-	31	
39	කළමනාකරණ සහකාර	196	167	29	
40	සහකාර උපදේශක (LRUC)*	38	28	-	
41	ඇමුණුම්කරු (මුද්‍රණ)	3	1	2	MA 1-2
42	නිවාඩු නිකේතන භාරකරු	2	-	2	
43	සුපරීක්ෂක (මුද්‍රණ)	1	-	1	
44	සුපරීක්ෂක (ගොඩනැගිලි)	1	-	1	
45	රියදුරු	67	53	14	PL 3
46	ගබඩාකරු*	2	2	-	
47	මුද්‍රණ සහයක	3	2	1	PL 2
48	බැඳුම්කරු (මුද්‍රණ)	2	1	1	
49	යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ)	2	2	-	
50	කාර්යාල සහයක	8	5	3	
51	මුරකරු*	65	33	-	PL 1
52	කම්කරු	101	80	21	
	එකතුව	**2733**	**1660**	**998**	

* දැනට වම තනතුර දරන පුද්ගලයින්ට පෞද්ගලික වන සේ අනුමත කර ඇත. ඔවුන් විශ්‍රාම යාමත් සමග වම තනතුර අහෝසි වේ.

මෙහෙයුම් කාර්යය මණ්ඩලය - 2023

	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය	වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය
1	HM 2-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර HM 1-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර	08	02	06
2	MM 1-3 විදුහල්පති	01	-	01
3	MM 1-1 කළමනාකාර	94	69	25
4	JM 1-1 කණිෂ්ඨ කළමනාකාර	178	100(*04)	75
5	MA 5-2 බලාත්මක කිරීමේ / ක්‍රියාත්මක කිරීමේ / ව්‍යාප්ති නිලධාරීන්	04	-	04
6	MA 4 ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවා	274	162	109
7	MA 3 ආශ්‍රිත නිලධාරීන්	35	07(*07)	01
8	MA 2-2 කළමනාකරණ සහකාර-තාක්ෂණ	1648	946	702
9	MA 1-2 කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන	241	196(*28)	35
10	PL 3 ප්‍රාථමික ශිල්පී	67	53	14
11	PL 2 ප්‍රාථමික අර්ධ ශිල්පී	09	07(*02)	02
12	PL 1 ප්‍රාථමික ශිල්පී නොවන	174	118(*33)	24
	එකතුව	**2733**	**1660**	**998**

* දැනට වම තනතුර දරන පුද්ගලයින්ට පෞද්ගලික වන සේ අනුමත කර ඇතග ඔවුන් විශ්‍රාම යාමත් සමග වම තනතුර අහෝසි වේ.



පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම

වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම

2023 වර්ෂයේ පුර්ණකාලීන පුහුණු වැඩසටහන් 1695 හා අර්ධකාලීන පුහුණු වැඩසටහන් 444 ක් දිවයින පුරා ක්‍රියාත්මක කර ආයතනික පුහුණුව සඳහා ඇතුලත් වූ ආධුනිකයින් සංඛ්‍යාව 39236 කි. ඉන් 2023.12.31 දිනට ආයතනික පුහුණුව අවසන් කල සංඛ්‍යාව 28835 කි. ආධුනිකයින් 7740 ක් 2024 වසරේදි පාඨමාලා අවසන් කිරීමට නියමිතය.


වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම / පුහුණුව අවසන් කිරීම

වර්ෂය	2019	2020	2021	2022	2023
පුහුණුවන්නන්ගේ ධාරිතාවය	18450	22450	21800	23180	22315
පුහුණුවට ඇතුලත් වූ සංඛ්‍යාව	37936	23417	33407	35001	39236
පුහුණුව අවසන් කල සංඛ්‍යාව	34235	19346	28539	29726	28835

2024 වසරේදි පාඨමාලා අවසන් කිරීමට නියමිත ප්‍රමාණය

පූර්ණකාලීන පාඨමාලා - 5029
අර්ධකාලීන පාඨමාලා - 2711
} 7740

අධ්‍යයන වාර අර්ධකාලීන සති අන්ත හා අධ්‍යයන වේලාවන් හඳුන්වා දෙමින් ආයතනික පුහුණු ධාරිතාවය ඉක්මවා ආධුනික බඳවා ගැනීම් සිදු කර ඇත.



සටහන : පුහුණු වැඩහලක එක් වරකට නිපුණතාවය ලබාදිය හැකි ආධුනික සංඛ්‍යාව ධාරිතාවය වේ.

පාඨමාලා ප්‍රතීතනය (Accreditation)


පූර්ණකාලීන පාඨමාලා - ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රමාණය (NVQ) -1210			
මට්ටම	ප්‍රතීතනය සම්පූර්ණ කර ඇති පාඨමාලා	ප්‍රතීතනය කිරීමට ඇති පාඨමාලා සංඛ්‍යාව*	එකතුව
3	242	33	275
4	825	81	906
5	29	-	29
	1096	**114**	**1210**

අර්ධකාලීන පාඨමාලා - ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රමාණය (NVQ) -110			
මට්ටම	ප්‍රතීතනය සම්පූර්ණ කර ඇති පාඨමාලා	ප්‍රතීතනය කිරීමට ඇති පාඨමාලා සංඛ්‍යාව*	එකතුව
3	61	15	76
4	20	6	26
5	3	3	6
6	2	-	2
	86	**24**	**110**

* තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ප්‍රතීතන කාර්යයන් සිදු කරමින් පවතී.

පුහුණු පාඨමාලා ක්ෂේත්‍ර අනුව ආධුනික බඳවා ගැනීම -2023


	ක්ෂේත්‍රය	ඇතුලත් වූ ආධුනික සංඛ්‍යාව (ආයතනික පුහුණුව)	ප්‍රතිශතය
1	කෘෂිකර්ම වැවිලි හා පශු සම්පත්	70	0.18%
2	මෝටර් රථ අලුත් වැඩියා හා නඩත්තුව	2992	7.63%
3	ගොඩනැගිලි හා ඉදිකිරීම්	3030	7.72%
4	විදුලි හා විද්‍යුත් සහ විදුලි සංදේශ	3803	9.69%
5	ආහාර තාක්ෂණය	1804	4.60%
6	මැණික් හා ස්වර්ණාභරණ	94	0.24%
7	හෝටල් හා සංචාරක	4066	10.36%
8	තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය	9600	24.47%
9	සම් ආශ්‍රිත නිෂ්පාදන	48	0.12%
10	ලෝහ හා ලුහු ඉංජිනේරු	1659	4.23%
11	කාර්යාල කළමනාකරණය	146	0.37%
12	දැව ආශ්‍රිත	846	2.16%
13	පුද්ගල හා සමාජ	6640	16.92%
14	මුද්‍රණ හා ඇසුරුම්	56	0.14%
15	ශීතකරණ හා වායුසමීකරණ	624	1.59%
16	රෙදිපිළි හා ඇඟළුම්	3530	9.00%
17	සෞඛ්‍ය හා සමාජ කටයුතු	73	0.19%
18	වෙනත්	155	0.39%
	එකතුව	**39236**	**100.00%**



සාමාජීය ඉල්ලුම වැඩි හා ස්වයං රැකියා, රැකියා අවස්ථා බහුල පාඨමාලා ක්ෂේත්‍ර

ක්ෂේත්‍රය	පිරිමි	ගැහැණු	එකතුව	ප්‍රතිශතය
තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය	3810	5790	9600	24.47%
පුද්ගල හා සමාජ	1399	5241	6640	16.93%
රෙදිපිළි හා ඇඟලුම්	522	3008	3530	9.00%
ආහාර තාක්ෂණය	1271	533	1804	4.59%
එකතුව	**7002**	**14572**	**21574**	**54.99%**

වෘත්තීය පුහුණුව සඳහා කාන්තා සහභාගිත්වය 68% කි.




ශ්‍රම වෙළඳපොල ඉල්ලුම සහිත රැකියා අවස්ථා බහුල පාඨමාලා සඳහා ඇතුලත්වන ආධුනික සංඛ්‍යාව සමස්ත ඇතුලත්වීමෙන් 43.38% කි.

ක්ෂේත්‍රය	පිරිමි	ගැහැණු	එකතුව	ප්‍රතිශතය
මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව	2956	36	2992	7.63%
ගොඩනැගිලි හා ඉදිකිරීම්	2584	446	3030	7.72%
විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ	3723	80	3803	9.69%
හෝටල් හා සංචාරක	3446	620	4066	10.36%
දැව ආශ්‍රිත	803	43	846	2.16%
ශීතකරණ හා වායුසමීකරණ	622	2	624	1.59%
ලෝහ සහ ලුහු ඉංජිනේරු	1648	11	1659	4.23%
එකතුව	**15782**	**1238**	**17020**	**43.38%**

මෙම ක්ෂේත්‍රයන් තරුණයින් වඩා ආකර්ෂණීය වන පාඨමාලාවන් වුවද 7% ක කාන්තා සහභාගීත්වයක් ද පවතී.

රැකියා අවස්ථා බහුල පාඨමාලා



සෘජුව රැකියාගත නොවන රැකියා අවස්ථාවන් සඳහා උපකාරී වන පාඨමාලා - 2023

පාඨමාලාව (Course)	ඇතුලත් වූ සංඛ්‍යාව (Enrollment)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී (Level 4)	3297
පරිගණක දෘඩාංග ශිල්පී - A Plus	921
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී (Level 3)	1740
පරිගණක දෘඩාංග ශිල්පී	119
එකතුව	**6077**

කාර්යය මණ්ඩලයේ දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කාර්යය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය වාර්ෂිකවම සිදුකරනු ලබන අතර ඒ සඳහා 2023 වර්ෂයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා රු. මිලියන 05 ක් වෙන් කරනු ලැබුවද ප්‍රතිපාදන සීමාවන් යටතේ අනධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීමට 2023 වසර තුලදී නොහැකි විය.

එසේ වුවද විවිධ අනුග්‍රහයන් යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් කටයුතු සිදු කර ඇත.

- සූපවේදී ප්‍රවීණයන් විසින් හෝටල් ක්ෂේත්‍රය ආශ්‍රිත කුසලතා හා සංවර්ධන පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම සහ උපදේශකවරු 140 දෙනෙකු පුහුණු කිරීම.
- Professional Cookery උපදේශකවරු 20 දෙනෙකු පුහුණු කිරීම.
- ඉතාලි තානාපති කාර්යාලය මගින් මෙහෙයවනු ලැබූ ඉතාලි ආහාර සම්බන්ධව වැඩසටහන් 02 ක් පැවැත්වීම සහ Professional, Cookery and Bakery උපදේශකවරු 40 දෙනෙකු පුහුණු කිරීම.
- වඩු කාර්මික ශිල්පී උපදේශකවරු සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 04 ක් පැවැත්වීම සහ උපදේශකවරු 56 දෙනෙකු පුහුණු කිරීම.

විදේශීය පුහුණුව - 2023

	ශිෂ්‍යත්වය	රට	සහභාගි වූ සංඛ්‍යාව
01	TVET ප්‍රතිපත්ති පිළිබඳ වැඩසටහන	කොරියානු ජනරජය	02
02	ප්‍රධාන තක්සේරුකරුවන් පුහුණු කිරීම පිලිබඳ වැඩසටහන - ශීතකරණ හා වායුසමීකරණ අංශයේ පුහුණුව ලබා දීම	මැලේසියාව	01
03	ශ්‍රම වෙළඳපල ඉල්ලුම ශක්තිමත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ රජයේ නිලධාරීන් සහ වෘත්තීය පුහුණුකරුවන් සඳහා TVET ධාරිතාවය ගොඩනැගීමේ වැඩසටහන	කොරියානු ජනරජය	09
04	TVET හි ඉංජිනේරු සැලසුම් සහ අධ්‍යාපන විද්‍යාව පිලිබඳ ගෝලීය පුහුණු වැඩසටහන	කොරියානු ජනරජය	01
05	වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ සම්මන්ත්‍රණය	චීනය	02
06	කර්මාන්ත ශාස්ත්‍රීය ඒකාබද්ධතාවය සහ තිරසාර ව්‍යවසායකත්වය පිළිබඳ ජාත්‍යන්තර සංවාදය	ඉන්දියාව	01


වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය

2023 වර්ෂයේ දිවයිනපුරා ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත පරිදි වේ.

පුහුණු මධ්‍යස්ථාන	2021	2022	2023
ජාතික වෘත්තීය පුහුණු ආයතනය	08	08	08
දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	22	22	22
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	179	179	172
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අනෙකුත් මධ්‍යස්ථාන (බන්ධනාගාර හා පුනරුත්ථාපන)	04	03	02
එකතුව	**213**	**212**	**204**

2023 වර්ෂය තුලදී ඵලදායීව ක්‍රියාත්මක නොවන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 08 ක් ක්‍රියාත්මක නොකර පාඨමාලා ආසන්නතම මධ්‍යස්ථානය වෙත අනුයුක්ත කරනු ලැබීය.

පුහුණු මධ්‍යාස්ථාන ව්‍යාප්තිය - 2023



වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය - 2023

පළාත	දිස්ත්‍රික්කය	ආයතන සංඛ්‍යාව						එකතුව
		NVTI	DVTC	VTC	AT	PC	Reh	
බස්නාහිර	ගම්පහ	-	1	11	2	-	-	12
	කොළඹ	3	1	10	1	-	-	14
	කළුතර	-	1	8	3	-	-	09
වයඹ	පුත්තලම	-	1	6	-	-	-	07
	කුරුණෑගල	-	1	6	-	-	-	07
උතුර	යාපනය	-	1	5	0	-	-	06
	කිලිනොච්චිය	-	1	4	-	-	-	05
	මුලතිව්	-	1	2	-	-	-	03
	මන්නාරම	-	-	1	-	-	-	01
	වව්නියාව	-	1	3	3	-	-	04
නැගෙනහිර	ත්‍රිකුණාමලය	-	1	6	-	-	-	07
	මඩකලපුව	1	-	10	-	-	-	11
	අම්පාර	-	1	11	1	-	-	12
දකුණ	ගාල්ල	2	1	12	3	2	-	15
	මාතර	1	-	12	-	-	-	13
	හම්බන්තොට	1	1	9	-	-	-	11
සබරගමුව	කෑගල්ල	-	1	7	1	1	-	08
	රත්නපුරය	-	1	9	-	-	-	10
ඌව	බදුල්ල	-	1	7	-	1	-	08
	මොණරාගල	-	1	7	-	[1]	-	09
මධ්‍යම	මහනුවර	-	1	8	-	2	-	09
	මාතලේ	-	1	4	-	-	-	05
	නුවරඑළිය	-	1	4	-	-	-	05
උතුරු මැද	අනුරාධපුර	-	1	7	1	-	-	8
	පොලොන්නරුව	-	1	3	1	[1]	-	5
එකතුව		**8**	**22**	**172**			**-**	**204***

NVTI	-	ජාතික වෘත්තීය පුහුණු ආයතන	8
DVTC	-	දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	22
VTC	-	වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	174 (බන්ධනාගාර මධ්‍යස්ථාන [2] සමඟ)
AT	-	අනුබද්ධිත	
PC	-	බන්ධනාගාර	
Reh	-	පුනරුත්ථාපන මධ්‍යස්ථාන	
[ ]	-	පුහුණු මධ්‍යස්ථාන ලෙස TVEC ලියාපදිංචිව ඇති මධ්‍යස්ථාන	

*TVEC හි ලියාපදිංචි මධ්‍යස්ථාන සංඛ්‍යාව


වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 204 ව්‍යාප්තිය

ජාතික වෘත්තිය පුහුණු ආයතන (NVTI) - 08

1. නාරාහේන්පිට
2. තලල්ල
3. රත්මලාන
4. මිරිජ්ජවිල
5. නියාගම
6. බද්දේගම
7. මඩකලපුව
8. ඔරුගොඩවත්ත

දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන (DVTC) - 22


වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන (VTC) - 174



වෘත්තීය පරීක්ෂණ හා ඇගයීම්

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණුව ලත් ආධුනිකයින් ඇගයීම් ක්‍රමවේදයන් මඟින් ඇගයීම් කර සහතිකපත්ලාභීන් බවට පත්කරනු ලැබේ. මේ සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 70 කට අධික මුදලක් වැයකරනු ලැබේ. වෘත්තීය පුහුණුව කෙරෙහි ඇති සාධනීය අභිප්‍රේරණයක් නිරූපණය කරමින් 2023 වර්ෂයේදී ඇගයීම් සිදුකර නිකුත් කල සහතිකපත් ප්‍රමාණය 30261 කි.එය 2022 වර්ෂයට වඩා 31% ක වැඩිවීමකි.


	වර්ෂය	2019	2020	2021	2022	2023
01	ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)	23534	17243	13746	17734	22635
02	ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ)	3527	962	3587	2356	4139
03	පෙරදැනුම ඇගයීම් ක්‍රමය (RPL)	2362	648	1413	3006	3487
	එකතුව	**29423**	**18853**	**18746**	**23096**	**30261**



වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය

තරුණ තරුණියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීමට මඟ පෙන්වීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තවත් කර්තව්‍යයකි. ඒ සඳහා සුදුසුකම්ලත් නිළධාරි මණ්ඩලයක් විසින් යෞවන යෞවනියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ඔවුන්ගේ අනාගත දිශානතිය ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීමට දීපව්‍යාප්තව වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පවත්වනු ලැබේ. 2023 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

ඉලක්කගත කණ්ඩායම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
පාසැල් සිසුන්	971	50240
පාසැල් හැරයන්නන්	811	44147
පුහුණුවන්නන්	1081	42139
දෙමාපියන්	556	24396
වෙනත්	650	27563
එකතුව	**4069**	**188485**



වෘත්තීය යතුර පරීක්ෂණය සිදුකිරීම තුලින් සිසු විභවතා හඳුනා ගැනීම, පාසල් සිසුන්ට හා රැකියා විරහිත තරුණ තරුණියන්ට තම විභවයන්ට ගැලපෙන වෘත්තීන් තෝරා ගැනීමට සහය වීම මේ තුලින් සිදු වේ.

අනු අංකය	ක්‍රියාකාරකම	සිදුකල ප්‍රමාණය
01	වෘත්තීය යතුර පරීක්ෂණය	7382
02	වෘත්තිය යතුර පරීක්ෂණය තනි පුද්ගල වශයෙන් විශ්ලේෂණය කල ප්‍රමාණය	3177

කර්මාන්ත සබඳතා හා රැකියාගත කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුවන්නන් වැඩිදුර පුහුණු ව සඳහා යොමු කිරීම, රැකියා අවස්ථා සඳහා යොමු කිරීම හා පවත්නා පාඨමාලා යාවත්කාලීන කිරීම අරමුණු කර ගනිමින් පිහිට වූ කර්මාන්ත සබඳතා ඒකකය මේ වන විට විවිධ පෞද්ගලික ආයතන හා එක්ව කටයුතු කිරීම අරඹා ඇත.

කර්මාන්ත සබඳතා ඒකකය විසින් ආයතනික පුහුණුව අවසන් කල පුහුණුලාභීන් වැඩිදුර පුහුණුව සඳහා යොමු කරනු ලබන අතර ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ලියාපදිංචි කරන ලද දේශීය හා විදේශීය රැකියා ආයතන මඟින් රැකියාගත කිරීම් කරනු ලැබේ.

එසේ රැකියාගත කිරීම සිදුකරනු ලබන්නේ පාඨමාලාව සාර්ථකව නිමකළ තරුණ තරුණියන් වන අතර පුහුණුව අවසන වන පහත වර්ගීකරණයන්ට ලක්වන සියල්ලන් රැකියාගත කිරීමට ලක්නොවේ.


- වෘත්තීය පුහුණු පාඨමාලා හදාරනු ලබන ත්‍රිවිධ හමුදා සාමාජිකයින්
- බන්ධනාගාර රැඳවියන්
- නැගෙනහිර පළාතේ හා පුත්තලම් දිස්ත්‍රික්කයන්හි පහත පාඨමාලා හදාරනු ලබන පුහුණුලාභීන් ප්‍රතිශතයක් බොහෝ විට තම පෞද්ගලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට පුහුණුව ලබා ගනු ලැබේ.
    - (a) රූපලාවණ්‍ය
    - (b) කොණ්ඩා සැකසුම්
    - (c) සාමාන්‍ය මැහුම්
- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 හා 4 හදාරා ඉදිරි NVQ මට්ටම් හැදෑරීමට බලාපොරොත්තු වන ආධුනිකයින් හා උසස් අධ්‍යාපනයට යොමුවන්නන්
- දැනුම, කුසලතා වර්ධනය කරගැනීම අරමුණු කරගත් අර්ධකාලීන පාඨමාලා හදාරනු ලබන්නන් පිරිසක් වීම.
- එමෙන්ම ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථාන වල පුහුණුව ලැබූ වැඩි පිරිසක් (මෙම පිරිස රැකියා බහුලව කේන්ද්‍රීයව පවතින නාගරික ප්‍රදේශයන්හි රැකියාගත වීමට ඇති අකමැත්ත හා ගෙවනු ලබන වැටුප් ඔවුනට නේවාසිකව සිට රැකියා කිරීමට ප්‍රමාණවත් නොවීම).
- අප ආයතනයේ ලියාපදිංචි නොවූ විදේශ රැකියා නියෝජිත ආයතන මඟින් විදේශ රැකියා සඳහා යොමුවන්නන්.

එසේ වුවද පවතින ආර්ථික අවපාතයන් යටතේ පවත්නා රැකියා අවස්ථා අහිමි වීම මතද දත්ත තහවුරු කර ගත් පුහුණුලාභීන් 16101 ක් රැකියාගත වීම 2023.12.31 දිනට වාර්තා වී ඇති අතර අනෙකුත් රැකියා ස්ථානගතවීම් තහවුරු කරගනිමින් පවතී.

කර්මාන්ත සබඳතා අංශය විසින් දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්ත සැසි පිහිටුවීම හා රැකියා වෙළඳපොල පැවැත්වීමට ආරම්භ කර ඇති අතර ඒ තුලින් රැකියාගතකිරීම තවදුරටත් වර්ධනය කර ගැනීමට අපේක්ෂිතය.

අංකය	පුහුණු ක්ෂේත්‍රය	රැකියාගත කල සංඛ්‍යාව			
		දේශීය	විදේශීය	ස්වයං	එකතුව
01.	ගොඩනැගිලි හා ඉදිකිරීම්	1244	38	215	1497
02.	මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව	1463	18	77	1558
03.	විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ	1784	34	200	2018
04.	ශීතකරණ හා වායු සමීකරණ	454	18	3	475
05.	ආහාර තාක්ෂණය	706	23	46	775
06.	සන්නිවේදනය හා බහුමාධ්‍ය තාක්ෂණය	1868	41	105	2014
07.	හෝටල් හා සංචාරක	2141	66	45	2252
08.	ලෝහ හා ලූහු ඉංජිනේරු	687	23	18	728
09.	දැව ආශ්‍රිත	295	6	61	362
10.	මැණික් හා ස්වර්ණාභරණ	57	5	8	70
11.	මුද්‍රණ හා ඇසුරුම්	21	-	-	21
12.	රෙදිපිළි හා ඇඟලුම්	1542	16	500	2058
13.	පුද්ගල හා සමාජ	1773	43	360	2176
14.	කෘෂිකාර්මික වැවිලි හා පශු සම්පත්	13	-	5	18
15.	සම් ආශ්‍රිත නිෂ්පාදන	1	4	11	16
16.	සෞඛ්‍ය හා සමාජ කටයුතු	7	16	-	23
	සේවක සුභසාධනය සහ වෙනත්	23,960.00	911,022.00
	දුරකථන ගාස්තු	23,222,325.81	28,100,251.43
	ප්‍රවාහනය	1,766,103.01	1,741,355.00
	ජලය	7,421,099.89	14,552,747.79
		260,127,626.08	**208,104,433.94**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

සටහන	2023 රු.	2022 නැවත සඳහන් කළ පරිදි රු.
23. රැකියා ගත කිරීම, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය		
විෂය මාලා සංවර්ධනය	93,245.00	405,530.00
සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය	20,451,600.00	5,345,565.06
ව්‍යවසායකත්ව වැඩසටහන්	690,962.90	624,246.25
රැකියාගත කිරීම	218,434.00	3,098,495.00
පර්යේෂණ සහ අන්වේශ්‍ය දීමනා	71,321.00	731,349.50
රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය	491,016.00	702,364.25
	22,016,578.90	**10,907,550.06**
24. වෙනත් මෙහෙයුම් වියදම්		
විභාග සහ ඇගයීම්	91,660,766.87	48,298,372.43
ගෞරව දීමනා	925,000.00	633,000.00
නීති ගාස්තු	493,750.00	592,402.00
විවිධ	4,508,506.02	4,251,539.37
තත්ව කළමනාකරණ ප්‍රතිපාදනය	1,632,033.00	5,549,408.50
වාර ප්‍රවේශ පත්‍ර	21,755,416.69	15,350,720.29
විශේෂ පුහුණු වැඩසටහන	-	349,485.00
වැටුප් දීමනා	-	-
ආවුද සහ පරිභෝජන	1,113,245.00	3,791,139.20
පුහුණු අධීක්ෂණය	-	316,604.00
අනුමත හැර යාම්	2,196,850.00	325,050.00
	124,285,567.58	**79,457,720.79**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

සටහන	2023 රු.	2022 නැවත සඳහන් කළ පරිදි රු.
25. විශේෂ ව්‍යාපෘති සඳහා වියදම්		
නිපුනත සවියට වියදම්	156,290,000.00	138,872,000.00
උපදේශකයින් දිරිගැන්වීම සඳහා වියදම්	-	112,827,689.50
ILO සඳහා වියදම්	290,458.70	6,409,201.85
අමාත්‍යාංශය සඳහා වියදම්	-	1,998.00
SSDP ව්‍යාපෘතිය සඳහා වියදම්	117,965,059.99	0.00
SFIG සඳහා වියදම්	5,833,466.65	371,666.00
Skillwork TVEC සඳහා වියදම්	-	607,680.00
	280,378,985.34	**259,090,235.35**
26. මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	233,251.93	166,881.00
	233,251.93	**166,881.00**
27. විනිමය නොවන ආදායම් - ප්‍රාග්ධන ප්‍රදානය		
රජයේ ප්‍රදානය - ප්‍රාග්ධනය	67,397,516.28	37,990,152.83
SSDP ප්‍රදාන	166,510,807.53	693,399.00
SFIG ව්‍යාපෘතිය	1,336,965.00	-
චීන ව්‍යාපෘතිය	341,740.00	5,769,800.00
ගැමා පීසා ව්‍යාපෘතිය	1,610,470.58	-
මුල් ළමාවිය ව්‍යාපෘති	-	12,864,127.94
අමාත්‍යාංශ	50,097,733.98	58,872,091.87
	287,295,233.37	**116,189,571.64**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

28. පෙර වසර ගැලපීම

පසු කාලීන සහ අඩු වියදම් ප්‍රතිපාදන පෙර වර්ෂයේ ගැලපීම ලෙස සකස් කරන ලදී

විස්තරය	හර	බැර	ශුද්ධ වෙනස
පාඨමාලා ගාස්තු ලැබිය යුතුය		105,350.00	105,350.00
වැටුප් ගෙවිය යුතුය	78,274.52		27,075.48
ගෙවිය යුතු අර්ධකාලීන වියදම්	242,100.00		(215,024.52)
ගෙවිය යුතු වෙනත්	297,767.00		(512,791.52)
ගොඩනැගිල්ල සඳහා ක්ෂය වෙන්කිරීම්	126,495,936.00		(127,008,727.52)
මෝටර් රථ සඳහා ක්ෂය වෙන්කිරීම්	8,134,386.00		(135,143,113.52)
ගොඩනැගිල්ල සඳහා ක්ෂය වෙන්කිරීම්		852,252,76	(134,290,860.76)
Int. In Suspense F.Lease		2,297,471.31	(131,993,389.45)
නැවත ඇගයීමේ අතිරික්තය	51,409,653.00		(183,403,042.45)
වාර ප්‍රවේශපත්‍ර විකතු විය	220,390.00		(183,623,432,.45)
ලැබිය යුතු වෙනත්		28,409.30	(183,595,023.15)
මාර්ගෝපදේශය උපචිත	25,000.00		(183,620,023.15)
විගණන ගාස්තු උපචිත		1,242,000.00	(182,378,023.15)

29. වගකීම් සහ ආවස්ථිකයන්

අ. අධිකාරියට විරුද්ධ නඩු

පහත සඳහන් ආකාරයෙන් අධිකාරියට විරුද්ධව නඩු බල පැවැත්වේ පහත සඳහන් ආකාරයෙන් අධිකාරියට විරුද්ධව නඩු බල පැවැත්වේ.

අධිකරණය	2023.12.31	2022.12.31
ශ්‍රේෂ්ඨාධිකරණය	02	02
අභියාචනාධිකරණය	01	02
මහාධිකරණය	01	01
දිස්ත්‍රික් උසාවිය	02	02
බේරුම්කරණය	02	03
කම්කරු විනිශ්චයාධිකරණය	03	02
එකතුව	**11**	**12**

ආ. ප්‍රාග්ධන වගකීම්

2023.12.31 දිනට ද්‍රව්‍ය ප්‍රාග්ධන වගකීම් නොමැත.

30. බොල් ණය ප්‍රතිපාදන

2023 වර්ෂය සඳහා වන ප්‍රකාශයේ රුපියල් මිලියන 959 ක හිඟයක් පවතින අතර ඉහත හිඟ පාර්තෝෂිත ප්‍රතිපාදන රු. මිලියන 44 ක් සහ භාණ්ඩ මිලියන 1,059 ක වත්කම් ක්ෂය වීම දැනටමත් වියදම් ලෙස අඩු කර ඇත.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2023 දෙසැම්බර් 31 ට ශේෂ පිරික්සුම

විස්තරය	හර	බැර
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම		
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අත්පත් කර ගැනීම	1,617,983,527.97	
ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම් අත්පත් කර ගැනීම	6,756,371,573.20	
මෝටර් වාහන අත්පත් කර ගැනීම	246,874,187.62	
වාහන කුලී රඳවා ගැනීම් අත්පත්කර ගැනීම (ෆිනෑන්ස්)	35,670,270.00	
Acq - කෘෂිකාර්මික සහ කිරි ගොවිපල උපකරණ	4,382,000.00	
Acq - විකාශන උපකරණ	87,000.00	
Acq - සන්නිවේදන උපකරණ	32,844,523.92	
Acq - පරිගණක උපකරණ	324,470,823.52	
Acq - ඉදිකිරීම් උපකරණ	783,100.00	
Acq - විදුලි උපකරණ	99,744,560.00	
Acq - ගිනි ආරක්ෂණ උපකරණ	160,105.00	
Acq - ගෘහ භාණ්ඩ	148,982,778.24	
Acq - කාර්මික සහ නිෂ්පාදන උපකරණ	677,156,105.00	
Acq - රසායනාගාර උපකරණ	12,643,600.00	
Acq - සංගීත භාණ්ඩ	62,500.00	
Acq - කාර්යාල උපකරණ	95,759,570.62	
Acq - සිතුවම්, මූර්ති සහ අනෙකුත් පුරාවස්තු	170,000.00	
Acq - වෙනත් උපකරණ	335,939,565.58	
ක්ෂයවීම් සඳහා වෙන්කිරීම		
ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම් ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		2,334,538,948.55
මෝටර් වාහන ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		187,989,151.29
වාහන කුලී රඳවා ගැනීම් ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		25,295,293.13
වෙනත් යන්ත්‍ර උපකරණ ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		817,949,154.60
ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ		
ප්‍රගතියේ පවතින වැඩ - ගොඩනැගිලි ව්‍යුහයන්	33,165,475.22	
ආයෝජන		
ස්ථාවර තැන්පතු	48,979,692.88	
ඉන්වෙන්ට්‍රි		
පුහුණු ද්‍රව්‍ය	40,295,814.86	
ලිපි ද්‍රව්‍ය	4,808,514.26	
වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය	2,795,562.00	

විස්තරය	හර	බැර
වෙනත් ලැබීම්		
වැඩසටහන් සඳහා අත්තිකාරම්	70,000.00	
ඉඩම් සඳහා අත්තිකාරම්	9,280,000.00	
අනිවාර්ය කටයුතු සඳහා තැන්පතු	3,227,736.75	
තැන්පතු	1,662,250.00	
පාඨමාලා ගාස්තු ලැබීම්	39,205,296.50	
වැටුප් ලැබීම්	1,345,919.10	
ආදායම් හිඟතාවයන්	11,732.00	
වෙළඳ සහ වෙනත් ලැබීම්	22,172,455.22	
පෙර ගෙවීම්	46,618.97	
බොල් ණය සඳහා ප්‍රතිපාදන		
සේවක ණය		
ආපදා ණය	44,062,699.83	
උත්සව අත්තිකාරම්	231,250.00	
මුදල් සහ මුදල් සමාන දෑ		
රන් කාසි	193,025.00	
බැංකු ගිණුම්		
අම්පාර	1,870,756.46	
අනුරාධපුරය	2,086,672.69	
බදුල්ල	1,609,023.15	
මඩකලපුව	512,255.29	
කොළඹ	6,845,275.69	
ගාල්ල	6,608,667.69	
ගම්පහ	9,651,378.91	
හම්බන්තොට	3,914,239.37	
ප්‍රධාන කාර්යාලය	98,630,582.94	
යාපනය	952,688.43	
කළුතර	5,596,704.98	
මහනුවර	8,221,804.76	
කෑගල්ල	1,510,293.92	
කිලිනොච්චිය	1,041,090.95	
කුරුණෑගල	487,501.81	
මාතලේ	1,418,638.43	
මාතර	507,820.07	
මොණරාගල	3,543,031.98	
මුලතිවු	1,124,270.33	

විස්තරය	හර	බැර
නුවරඑළිය	5,002,318.28	
NVTI - බද්දේගම	2,664,100.47	
NVTI - මිරිජ්ජවිල	3,717,722.85	
NVTI - නාරාහේන්පිට	3,937,373.36	
NVTI - නියාගම	1,130,028.50	
NVTI - ඔරුගොඩවත්ත	13,612,643.23	
NVTI - රත්මලාන	1,580,235.51	
NVTI - තලල්ල	1,617,057.13	
පොළොන්නරුව	2,710,751.42	
පුත්තලම	4,011,923.60	
රත්නපුරය	3,884,331.69	
ත්‍රිකුණාමලය	980,552.60	
ඌව පළාත		
බස්නාහිර පළාත		
වවුනියාව	281,836.82	
සබරගමුව පළාත		
අහංගම සීස්කේප් හෝටලය	1,108,433.42	
දකුණු පළාත		
අතැති මුදල්	14,231.00	
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන		
රජයේ ප්‍රදාන (භාණ්ඩාගාර) - පුනරාවර්තන		287,295,233.37
වෙන් කිරීම් සහ අතිරික්ත		
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		624,118,353.72
ප්‍රත්‍යාගණනය කළ අතිරික්තය		3,088,702,509.69
විලම්භිත ආදායම් ප්‍රදාන		1,671,239,905.00
ප්‍රාග්ධන නොවන වගකීම්		
BOC - ෆිනෑන්ස් කුලී වගකීම		5,717,920.00
අවිනිශ්චිතභාවයේ පොලී	260,440.74	
ගෙවීම්		
විගණන ගාස්තු ගෙවීම්		1,406,413.00
පාඨමාලා ගාස්තු ගෙවීම්		330,400.00
තැන්පතු		55,000.00
E.P.F. ගෙවීම්		14,965,300.79
E.T.F. ගෙවීම්		2,244,795.76
දේශක ගාස්තු ගෙවීම්		18,446,370.00
වෙනත් ගෙවීම්		20,151,561.14

විස්තරය	හර	බැර
යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - 13 වසර		27,409,701.46
ව්‍යාපෘති ආධාර ගෙවීම්		3,576,482.86
නිපුණතා සිසු සවිය		3,348,000.00
අන්තර් කාලීන වර්ධනය උදෙසා නිපුණතා වැඩසටහන්		4,664,598.87
අත්තිකාරම් වශයෙන් ලැබීම්		49,297,891.50
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		2,101,752.02
රඳවාගත් මුදල්		4,661,610.48
වැටුප් ගෙවීම්		2,711,485.24
කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම්		104,500.00
ශිෂ්‍ය රක්ෂණ ගෙවීම්		37,883,500.00
වෙළඳ ණය ගැතියන්		9,519,030.01
සමුච්චිත වියදම්		
සමුච්චිත වෘත්තීය මාර්ගෝපදේශනය		60,350.00
සමුච්චිත විදුලි බලය		10,021,061.21
සමුච්චිත විභාග සහ ඇගයීම්		11,248,210.50
සමුච්චිත ඉන්ධන සහ ලිහිසුස්ම්		22,405.00
සමුච්චිත සනීපාරක්ෂක සේවා		1,838,355.00
සමුච්චිත නඩත්තු		2,085,671.41
සමුච්චිත පුවත්පත් සහ වාර සඟරා		97,240.00
සමුච්චිත සේවාස්ථ පුහුණුව		435,500.00
සමුච්චිත අතිකාල සහ නිවාඩු දින ගෙවීම්		2,118,556.64
සමුච්චිත අර්ධ කාලීන වියදම්		30,888,121.00
සමුච්චිත ප්‍රවර්ධන වියදම්		1,835,840.48
සමුච්චිත කුලී, වරිපනම් සහ බදු		76,538.00
සමුච්චිත වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු		6,590,894.27
සමුච්චිත ආරක්ෂණ ගාස්තු		6,448,254.39
සමුච්චිත දුරකථන ගාස්තු		2,685,834.34
සමුච්චිත ප්‍රවාහන ගාස්තු		102,100.00
සමුච්චිත ප්‍රවාහනය		782,178.80
සමුච්චිත ජලය		1,384,702.64
වාහන් කුලී ගාස්තු		50,000.00
වෙනත් ආදායම්		
වෙන්දේසි ආදායම		1,513,250.00
පාඨමාලා ගාස්තු		124,518,555.00
ආපනශාලා ආදායම		157,400.00
අවබෝධතා ගිවිසුම ලියාපදිංචි ගාස්තු		240,000.00

විස්තරය	හර	බැර
සමාගම් ලියාපදිංචිය		
දෛනික කටයුතු		4,980,400.00
ව්‍යවසායකත්ව වැඩසටහන්		47,500.00
දඩ		1,296,511.37
රක්ෂණ හිමිකම්		1,617,969.89
ශාලා ආදායම		4,233,700.00
නේවාසිකාගාර ගාස්තු		2,597,230.00
සංචාරක බංගලාව - කතරගම		293,000.00
ණය වාරික		1,835,496.86
විවිධ ආදායම්		4,886,790.25
ආපසු නොගෙවන ලද ටෙන්ඩර් තැන්පතු		82,500.00
වාර්තා පොත		7,226,000.00
ලියාපදිංචි ගාස්තු		16,711,150.00
නිමැවුම් භාණ්ඩ විකිණුම්		467,823.00
ඉතුරුම් ගිණුම් පොළී		8,418,775.66
සැපයුම් ලියාපදිංචිය		1,186,000.00
විභාග ගාස්තු		21,332,281.00
රැකියා පුහුණු පොත් ආදායම මත		453,600.00
ඉපැයීම් 10%		5,714,490.57
නිෂ්පාදන ඒකක ආදායම		
අර්ධ කාලීණ පාඨමාලා		
අර්ධකාලීන ලියාපදිංචි ගාස්තු ආදායම		4,555,400.00
අර්ධකාලීන පාඨමාලා ගාස්තු ආදායම		128,734,657.25
අර්ධකාලීන වාර්තා පොත් ආදායම		89,650.00
අර්ධකාලීන දෛනික දිනපොත ආදායම		148,650.00
අර්ධකාලීන විභාග ගාස්තු ආදායම		5,438,300.00
50% වට්ටමක් (අර්ධ කාලීන)	181,304.00	
කාර්ය මණ්ඩලය සඳහා 75% වට්ටමක් (P/T)	417,525.00	
අනුමත අත්හැරීම් (P/T)	4,345,650.00	
අර්ධ කාලීන විදුලිය	912,163.70	
අර්ධ කාලීන විභාගය සහ ඇගයීම	1,754,013.00	
අර්ධකාලීන දේශන ගාස්තු වියදම්	43,341,310.17	
අර්ධකාලීන විවිධ වියදම්	135,400.00	
අර්ධකාලීන කාර්ය මණ්ඩල දිරිගැන්වීම	732,808.00	
අර්ධ කාලීන ලිපි ද්‍රව්‍ය	67,252.50	
අර්ධ කාලීන අධීක්ෂණය සහ වෙනත් දීමනා	515,182.00	
අර්ධකාලීන දුරකථන	233,698.48	

විස්තරය	හර	බැර
ආර්ධකාලීන ජලය	199,789.00	
ආර්ධකාලීන පුහුණු ද්‍රව්‍ය	15,556,788.72	
මුද්‍රණ පාසල		
මුද්‍රණ පාසල් ආදායම		801,800.00
මුද්‍රණ පාසල් පුහුණු ද්‍රව්‍ය	680,805.20	
RPL		
RPL ආදායම		54,885,827.00
RPL ආදායම් ILO		
RPL ආදායම් අතුරු අයවැය - අමාත්‍යාංශය	12,760.00	
ILO (RPL) සඳහා වියදම්	18,910.00	
අතුරු අයවැය (RPL) සඳහා වියදම්		
RPL වියදම් - විභාග ගාස්තු	12,590,001.48	
EPL වියදම් - වෙළඳ දැන්වීම		
EPL වියදම් - නඩත්තු යන්ත්‍රය		
EPL වියදම් - පැනල් මණ්ඩලය සහ අධීක්ෂණය	1,575,774.50	
EPL වියදම් - කාර්ය මණ්ඩල දිරිගැන්වීම	35,750.00	
EPL වියදම් - පුහුණු ද්‍රව්‍ය	860,109.71	
වෙළඳ පරීක්ෂණය		
වෙළඳ පරීක්ෂණ ආදායම		
වෙළඳ පරීක්ෂණ කාර්ය මණ්ඩල දිරිගැන්වීම		
වෙළඳ පරීක්ෂණ පුහුණු ද්‍රව්‍ය		
සිස්කේප් හෝටලය - අහංගම		
ආහාර පාන ආදායම		550,650.00
ශාලාවේ ආදායම (මුහුදු දර්ශන)		15,500.00
සංචිත ආදායම		132,187.50
කුලී ආදායම (ස්ථානය)		294,200.00
කාමර ආදායම		1,845,585.71
විදුලි	611,017.47	
ආහාර පාන වියදම්	274,722.50	
සනීපාරක්ෂක සේවය	527,076.94	
රෙදි සෝදන ගාස්තු	50,580.00	
ගොඩනැගිල්ල නඩත්තු කිරීම	219,176.00	
යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම	164,730.00	
විවිධ වියදම්	44,865.50	
අතිකාල සහ නිවාඩු ගෙවීම	240,080.66	
ජල බිල්පත	300,838.46	

විස්තරය	හර	බැර
අර්ධ කාලීන කෙටි පාඨමාලාව		
PTSP - ලියාපදිංචි ගාස්තු ආදායම		1,290,400.00
PTSP - පාඨමාලා ගාස්තු ආදායම		47,553,470.00
PTSP - තක්සේරු ආදායම		6,144,740.00
PTSP - සහතික ආදායම		4,812,050.00
PTSP - විදුලි වියදම්	301,596.00	
PTSP - විභාගය සහ ඇගයීම. වියදම්	563,480.00	
PTSP - දේශන ගාස්තු වියදම්	17,928,510.00	
PTSP - සහායක කාර්ය මණ්ඩල වියදම්	349,150.00	
PTSP - Telephone) Int. වියදම්	85,537.00	
PTSP - පුහුණු ද්‍රව්‍ය වියදම්	6,736,669.90	
PTSP - ජල වියදම්	149,184.00	
වෙනත් නිෂ්පාදන ඒකකය		
තලල්ල ආපනශාලා ආදායම		1,532,254.00
IDM ආදායම		
තලල්ල ආපනශාලා වියදම්	1,232,063.20	
වෙනත් නිෂ්පාදන ඒකක ආදායම		4,823,392.00
IDM වියදම්		
වෙනත් නිෂ්පාදන ඒකකය - ලිපි ද්‍රව්‍ය	27,425.00	
වෙනත් නිෂ්පාදන ඒකකය - ශ්‍රම වියදම්	105,780.00	
වෙනත් නිෂ්පාදන ඒකකය - දේශන ගාස්තු	1,029,125.00	
වෙනත් නිෂ්පාදන ඒකකය - Miscellanies Exp	210,494.00	
වෙනත් නිෂ්පාදන ඒකකය - පුහුණු ද්‍රව්‍ය	477,630.00	
වෙනත් නිෂ්පාදන ඒකකය - ප්‍රවාහන Exp	174,975.00	
විශේෂ ව්‍යාපෘති සඳහා අරමුදල්		
SFIG සඳහා අරමුදල්		5,833,466.65
SSDP ව්‍යාපෘතිය සඳහා වියදම්		117,965,059.99
ILO සඳහා අරමුදල්		290,458.70
නිපුණතා සිසුසවිය මත අරමුදල්		156,290,000.00
සේවක වියදම		
E.P.F. වියදම්	112,253,102.71	
E.T.F. වියදම්	28,067,429.16	
වෙනත් දීමනා (කාර්ය මණ්ඩල වියදම)	263,071,231.00	
වැටුප් සහ අතිකාල	812,125,424.43	
කාර්ය මණ්ඩල පාරිතෝෂිකය	42,817,223.57	

විස්තරය	හර	බැර
ගමනාගමනය		
නවාතැන් වියදම්	183,695.00	
ගමනා ගමනය - දේශීය	7,668,239.79	
ගමනාගමනය - විදේශීය	2,111,755.27	
භාණ්ඩ සමීක්ෂණ වියදම්	6,081,709.00	
සැපයුම් සහ වෙනත් පරිභෝජන ද්‍රව්‍ය		
ඉන්ධන සහ ලිහිස්සුම් ගාස්තු	28,446,279.18	
වෙනත් සැපයුම්	1,383,898.48	
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	6,963,210.36	
මුද්‍රිත ද්‍රව්‍ය	11,055,086.69	
නඩත්තුව		
ගොඩනැගිලි නඩත්තු කිරීම	10,032,320.09	
දේපල සහ පිරියත නඩත්තුව	5,544,697.05	
වාහන නඩත්තු කිරීම	12,895,697.54	
කාර්යාල උපකරණ නඩත්තුව	4,413,217.51	
ගිවිසුම්ගත සේවා		
වෙළඳ දැන්වීම්	979,685.00	
විගණන ගාස්තු	1,200,000.00	
විදුලි බල ගාස්තු	119,949,955.96	
කුලී අය කිරීම්	600,000.00	
රක්ෂණය	3,120,492.53	
සනීපාරක්ෂක සේවා	24,570,125.87	
පුවත්පත් සහ වාර ප්‍රකාශන	442,801.00	
තැපැල් ගාස්තු	1,226,922.84	
කුලී, වරිපනම් සහ බදු	7,700,496.21	
ආරක්ෂක ගාස්තු	57,903,657.96	
කාර්ය මණ්ඩල සුභසාධනය සහ වෙනත්	23,960.00	
දුරකථන ගාස්තු	23,222,325.81	
ප්‍රවාහනය	1,766,103.01	
ජල බිල්පත්	17,421,099.89	
උපදෙස් සහ වෘත්තීය ගාස්තු		
රැකියාගත කිරීම, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය		
විෂයමාලා සංවර්ධනය	93,245.00	
සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය	20,451,600.00	
ව්‍යවසායකත්ව වැඩසටහන්	690,962.90	

විස්තරය	හර	බැර
රැකියාගත කිරීම	218,434.00	
පර්යේෂණ සහ අන්වේෂ්‍ය අධ්‍යයන	71,321.00	
පුද්ගලික සහ රාජ්‍ය හවුල්කාරිත්වය	491,016.00	
වෙනත් මෙහෙයුම් වියදම්		
අනුමත හැරයාම්	2,196,850.00	
විභාග සහ ඇගයීම්	91,660,766.87	
ප්‍රසාද දීමනා	925,000.00	
නෛතික ගාස්තු	493,750.00	
විවිධ වියදම්	4,508,506.02	
තත්ව කළමනාකරණය සහ ප්‍රතීතනය	1,632,033.00	
වාර ප්‍රවේශ පත්‍ර	21,755,416.69	
විශේෂ පුහුණු වැඩසටහන		
ආයුධ සහ පර්යේෂණ ද්‍රව්‍ය	1,113,245.00	
පුහුණුව අධීක්ෂණය		
විශේෂ ව්‍යාපෘති සඳහා වියදම		
නිපුණතා සිසු සවිය සඳහා වියදම	156,290,000.00	
ILO සඳහා වියදම්	290,458.70	
SSDP ව්‍යාපෘතිය සඳහා වියදම්	117,965,059.99	
SFIG සඳහා වියදම්	5,833,466.65	
මූල්‍ය පිරිවැය		
බැංකු අය කිරීම්	233,251.93	
පුහුණු ද්‍රව්‍ය	150,966,328.01	
කාර්ය මණ්ඩල පුහුණුව - ධාරිතා සංවර්ධනය	1,995,174.85	
ප්‍රවර්ධන වියදම්	6,310,371.99	
වෘත්තීය මාර්ගෝපදේශනය	667,883.00	
ක්ෂය වීම්	1,066,300,910.46	
මූල්‍ය ලීසිං සඳහා පොලී	1,245,187.95	
කල්බදු ක්‍රමය යටතේ වාහන බද්දට / කුලියට දීම	4,667,567.04	
ලාභ /පාඩු ගිණුම්		3,973,855,042.07
පෙර වසරේ ගැලපීම්		182,378,023.15
එකතුව	**14,234,567,863.78**	**14,234,567,863.78**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

මූල්‍ය විග්‍රහය 2013 - 2023

	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
මෙහෙයුම් ආදායම්	1,260.19	1,330.71	1,558.42	1,683.74	1,827.18	1,621.82	2,116.82	2,243.71	1,531.00	1,744.23	1,671.24
වෙනත් ආදායම්	123.87	156.23	161.19	179.17	42.81	61.75	84.75	68.79	116.31	177.63	357.49
ව්‍යාපෘති ආදායම්	5.33	75.69	118.27	183.44	170.20	195.65	175.43	90.71	197.30	259.09	280.38
මුළු ආදායම	**1,389.39**	**1,562.63**	**1,837.88**	**2,046.35**	**2,040.19**	**1,879.22**	**2,377.00**	**2,403.20**	**1,844.61**	**2,180.95**	**2,309.10**
පුනරාවර්ථන වියදම්	1,014.93	1,157.94	1,398.52	1,432.36	1,610.44	1,671.17	1,753.55	1,665.55	1,678.51	1,944.54	1,927.63
වත්කම් ක්ෂය	423.09	405.46	396.42	397.27	391.66	141.35	525.32	681.46	533.66	448.37	1,059.12
ව්‍යාපෘති වියදම්	5.33	75.69	118.27	183.44	170.20	195.65	175.43	90.71	197.30	259.09	280.38
මුළු වියදම	1,443.35	1,639.09	1,913.21	2,013.07	2,172.30	2,008.17	2,454.30	2,437.71	2,409.47	2,652.00	3,267.12
අතිරික්තය / (ඌනතාවය)	**(53.96)**	**(76.46)**	**(75.34)**	**33.28**	**(132.12)**	**(128.95)**	**(77.30)**	**(34.51)**	**(564.86)**	**(471.06)**	**(958.02)**
ශුද්ධ ස්ථාවර වත්කම්	5,380.76	5,383.09	5,387.25	5,420.89	5,438.45	6,191.13	6,509.20	8,034.59	7,761.26	7,900.96	7,106.46
ජංගම වත්කම්	147.59	170.47	194.29	264.68	228.78	341.69	308.58	266.42	243.84	230.30	371.80
	5,528.35	**5,553.55**	**5,581.54**	**5,685.57**	**5,667.23**	**6,532.82**	**6,817.78**	**8,301.01**	**8,005.10**	**8,131.26**	**7,478.25**
හිමිකම්	5,187.09	5,149.05	5,095.95	5,223.99	5,145.10	5,784.72	6,016.84	7,513.19	7,182.79	7,257.34	6,567.03
වෙන්කිරීම්	234.26	283.27	373.82	306.15	369.32	437.39	506.84	587.43	612.12	641.38	624.12
වගකීම්	106.99	121.23	111.76	155.42	152.82	310.71	294.10	200.39	210.20	232.54	287.11
	5,528.35	**5,553.55**	**5,581.54**	**5,685.57**	**5,667.23**	**6,532.82**	**6,817.78**	**8,301.01**	**8,005.10**	**8,131.26**	**7,478.25**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VOT/D/VTA/1/2023/34 මඟේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2024 මැයි 31 දින

සභාපති
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 21 ඡේදය අනුව වියදමක් ලෙස හඳුනාගත යුතු මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තු වියදම් රු.1,501,393ක් මෝටර් රථ ගිණුමට ප්‍රාග්ධනීත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2023 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ගිණුමේ ශේෂය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 14 ඡේදය අනුව අධිකාරිය විසින් පුහුණු මධ්‍යස්ථාන ලෙස භාවිත කරනු ලබන ඉඩම් හා එම ඉඩම්වල ඉදිකරන ලද ගොඩනැගිලි 28ක වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 47 ඡේදය අනුව ප්‍රත්‍යාගණීත වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට සෑම වර්ෂ තුනකට හෝ වර්ෂ පහකට වරක්වත් ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් අධිකාරිය විසින් ප්‍රත්‍යාගණන ආකෘතියට ගිණුම් තබා ඇති රු.6,098,701,187 ක වටිනාකමින් යුතු ඉඩම්, ගොඩනැගිලි හා මෝටර්රථ වර්ෂ 5 සිට වර්ෂ 15 දක්වා කාල පරිච්ඡේදයක් තුල ප්‍රත්‍යාගණනය සිදු කර නොතිබීම හේතුවෙන් එම වත්කම් පංති 03 හි සාධාරණ අගය නිරූපණය නොකෙරුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ පාඨමාලා ආදායම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණනයේදී පුහුණු මධ්‍යස්ථාන 05ක 2023 වර්ෂයේදී ආරම්භ කරන ලද පාඨමාලා 43කින් ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ රු.6,952,728ක ආදායම විලම්බිත ආදායම් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා විලම්බිත ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) අධිකාරිය විසින් සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගණනය කිරීමේදී එක් එක් සේවකයන් සේවයට බැඳුනු දිනය පදනම් කරගෙන නොතිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු.26,046,767 ක් අඩුවෙන් හා සමුච්චිත අරමුදල එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2022 මැයි 25 දින ආරම්භ කර තිබූ රු.මිලියන 48 ක ස්ථාවර තැන්පතුවට අදාල පොලී ආදායම උපචිත පදනම මත ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.124,695 කින්ද සමුච්චිත අතිරික්තය රු.4,923,568 කින් හා ලැබිය යුතු පොලී ආදායම රු.5,048,263 කින් ද අඩුවෙන් දක්වා තිබුණි.

(උ) අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථානවල 2023 වර්ෂයේදී භාණ්ඩ සොරකමකට අදාලව සිදු වී තිබූ රු.7,127,888ක අලාභය ආරක්ෂක සේවා සපයන ආයතනයෙන් ගෙවීමට එකඟවී තිබීම නිසා ලැබිය යුතු ලෙස දැක්වීම වෙනුවට ආරක්ෂක සේවා වියදමින් අඩුකර දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) Skill for Inclusive Growth (SFIG) ව්‍යාපෘතිය මඟින් අභ්‍යංගම හා කඳුරුවල පුහුණු මධ්‍යස්ථාන සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ රු.65,170,697 ක පුහුණු උපකරණ හා රු.4,540,165 ක් වටිනා පුහුණු ද්‍රව්‍ය ද 2022 වර්ෂයේදී ලැබී තිබූ රු.1,777,500 ක මාධ්‍ය උපකරණ ද ගිණුම්ගතකර නොතිබුණි.

(එ) 2023 වර්ෂයේදී උපදේශකවරුන්ට දීමනා ගෙවීම වෙනුවෙන් රු.107,323,495 ක් පමණක් අමාත්‍යාංශයෙන් ලැබී තිබියදී මූල්‍ය ප්‍රකාශනවල රු.117,168,560 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා වියදම රු.9,845,065 ක් වැඩියෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඒ) 2023- 2027 සංයුක්ත සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් උපදේශක ආයතනයකට ගෙවීම සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන ආමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු.1,000,000 ක මුදල ලැබීම් හා ගෙවීම් එකම ගිණුමක් තුලින් සිදුකර තිබීම හේතුවෙන් අදාල වියදම මූල්‍ය ප්‍රකාශනවලින් හෙලිදරව් වී නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත

විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ

පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල , පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2023 වර්ෂය සඳහා සනීපාරක්ෂක සේවාව ප්‍රසම්පාදනයේදී නියමිත දිනයට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු නොකර පසුගිය වර්ෂ 02 හි කොන්ත්‍රාත්තුව පවරා තිබූ දෙවන අවම මිල ඉදිරිපත් කර තිබූ සැපයුම්කරුටම කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් අධිකාරියට රු.2,038,700 ක පාඩුවක් සිදු වී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) පූර්ණ කාලීන පාඨමාලා සඳහා ගාස්තු අයකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී නොතිබුණු පාඨමාලා 16 කින් සමාලෝචිත වර්ෂයේ දී රු.19,003,930 ක පාඨමාලා ගාස්තු අයකර තිබුණි.

(ආ) හම්බන්තොට මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද වැඩහල් ගොඩනැගිල්ල සඳහා රු.19,053,095 ක් වැයකිරීමෙන් පසුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2015 ජනවාරි 05 දින සිට ඉදිකිරීම් අත්හිටුවා තිබුණද කොන්ත්‍රාත්කරුට විරුද්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යොමු වී නොතිබුණු අතර අතරමඟ නවතා ඇති ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැගිල්ල 2023 වර්ෂය අවසන් වන විටද භාවිත තත්ත්වයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරිය සතු වාහන අළුත්වැඩියා කිරීම හා වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන සිසුන් සඳහා රැකියාගත පුහුණුව ලබාදීමේ අරමුණ ඇතිව අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට පවත්වාගෙන තිබුණු වාහන නඩත්තු ඒකකය ආයතනයේ කාර්යසාධනයට එලදායී ලෙස දායක වී තිබියදී විවිධ හේතු මත 2018 දෙසැම්බර් 31 දින සිට විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව වසාදමා තිබූ අතර මෙම ඒකකය සතුව තිබූ උපකරණ භාවිතා කිරීමෙන් තොරව මෝටර් රථ කාර්මික අංශයේ ගබඩා කර තිබුණි.

(ඈ) ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබාගැනීමට කටයුතු නොකර 2017 වර්ෂයේදී කුච්චවේලි හෝටල් පාසලේ ආධුනිකයින් 52 දෙනෙකුට නවාතැන් ලබාදිය හැකි අංග සම්පූර්ණ කාමර 12 කින් සමන්විත දෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් රු.මිලියන 140.21 ක් වැයකර ඉදිකර තිබුණද එම වර්ෂයේ සිට මේ දක්වාම ස්ථීර ජල සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ආධුනිකයන්ගේ නේවාසිකාගාර ලෙස භාවිතා කිරීමට නොහැකිවී තිබුණි.

(ඉ) 2010 වර්ෂයේ දී රු.5,823,000 ක් වැයකර මිලදීගෙන තිබූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හේනකඩුව වෙලේවත්ත පිහිටි රූඩ් 02 පර්චස් 33.5 ක ඉඩම හා 2017 වර්ෂයේදී රු.34,030,346 ක් වැයකර දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගත් පානදුර මෝදරවිල පිහිටි අක්කර 01 කින් යුත් ඉඩම් 2023 වර්ෂය වන විටත් වෘත්තීය පුහුණුව සඳහා එලදායීව භාවිතා කිරීමකින් තොරව පැවතුණි.

(ඊ) අමාත්‍යාංශය හා වෙනත් ආයතන මඟින් විවිධ කාර්යයන් සඳහා වර්ෂ 2019 සිට 2022 දක්වා අධිකාරිය වෙත ලබා දී තිබූ රු.38,998,981 ක් අදාල කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව මෙම වාර්තාවේ දිනය වන විටත් බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යව රඳවා ගෙන තිබුණි.

(උ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පූර්ණ (සියයට 100ක) කොටස් අයිතිය සහිතව 2013 දෙසැම්බර් 18 දින කැබිනට් අනුමැතියක් රහිතව අධිකාරියේ අරමුදල් වලින් VTA Holdings Ltd නමින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචිකර තිබූ සමාගම ඇවර කිරීමට අවශ්‍ය ලේඛන 2022 ජූනි 20 දින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත භාර දීමට කටයුතු කර තිබුණි. සමාගමේ බැංකු ගිණුම් හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වාර්තාවක්

සකස් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් ලබා දී තිබුණද එම වාර්තාව 2023 ජූලි 20 දින වන විටද සකස්කර නොතිබුණි.

(උ) 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ලැබිය යුතු පාඨමාලා ගාස්තු ගිණුමේ ශේෂය රු.39,205,296 ක් වූ අතර එයින් රු.7,628,756 ක් වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාලයක සිට පැවත එන ශේෂ වූ අතර එම ශේෂ අය කර ගැනීමට අධිකාරියට නොහැකිව තිබුණි.

(එ) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ (Physical Action Plan) ඇතුලත් කාර්යයන් 12ක් සමාලෝචිත වර්ෂය තුලදී ඉටු කරගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණු අතර කාර්යයන් 03 ක ඉටුකරගැනීමේ භෞතික ප්‍රගතිය සියයට 3 ත් සියයට 38 ත් අතර විය.

(ඒ) 2023 වර්ෂයේ වෘත්තීය පුහුණු අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අනුව, සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රතීතනය කළ නව හා පැවති පාඨමාලා සංඛ්‍යාව හා ලියාපදිංචිය යාවත්කාලීන කළ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පිළිවෙලින් 67 ක්, 281 ක් හා 91 ක් වූ නමුත් තෘතියික හා අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු අනුව එම තොරතුරු පිළිවෙලින් 136 ක්, 354 ක් හා 103 ක් වූ බැවින් අදාල තොරතුරුවල නොගැලපීමක් පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපති,

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු වාර්තාව

1.2

(අ) මෙම අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු සිදු කරන ලද වාහන අලුත්වැඩියාවන් සිදු නොකළේ නම් තවදුරටත් ඉතාමත් සීමිත කාලයක් පමණක් ධාවනය කළ හැකි මට්ටමක පැවතුණි. ඒ අනුව මෙම අලුත්වැඩියාවන් අභ්‍යන්තර අලුත්වැඩියා ලෙස සිදු කර ඇති අතර (30/2016 චක්‍රලේඛය අනුව) අලුත්වැඩියාවෙන් පසු මෙම රථ වල ආයුකාලය වර්ධනය වී ඇති හෙයින් සහ එම වාහන උපරිම කාර්යක්ෂමතාවයකින් ධාවනය කළ හැකි මට්ටමක පවතින බැවින් මෙම අලුත්වැඩියාවන් සඳහා වූ වියදම් ප්‍රාග්ධනිත කිරීම සිදු කරන ලදී.

2024 වර්ෂයේ සිට මෙම තත්වය පුනරාවර්තන වියදම් යටතේ ඇතුළත් කිරීමට කටයුතු කරමි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරන ප්‍රමිත 7(49) අනුව මුළු වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ පසු ගිණුම් වලට ගැළපීම සිදු කළ යුතු වේ. 2024.04.30 දින වන විට ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය සතු ඉඩම් 28 න් 24 ක වටිනාකම් තක්සේරු කර ඇත. ඉතිරි ඉඩම් තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු මෙන්ම සිහිකැඳවීම්ද තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා තිබෙන අතර අදාල තක්සේරු වටිනාකම ලැබුණු පසු ගිණුම් ගත කිරීම් සිදු කරනු ලැබේ .

මේ පිළිබඳව ඉදිරියේදී තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර අවශ්‍ය සිහිකැඳවීම් සිදු කිරීමට කටයුතු කරමි.

(ඇ) මෙම වත්කම් පන්ති තුනට අදාලව මෝටර් රථ 2018 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගතකර තිබේ. මේ වන විට නැවත ප්‍රත්‍යාගණනය කටයුතු සිදුකරමින් සිටින අතර එය අවසන්වූ වහාම ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත. ඉඩම් 28න් 24ක් මේ වන විට තක්සේරු කර ඇති අතර ඉතිරි ඉඩම් 04 සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුවෙන් වාර්තා ලැබූ පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. තවද වෘත්තිය පුහුණු අධිකාරියට පවරා නොගත් ඉඩම් වල ඉදිකරන ලද ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු නොකරන බැවින් මෙම ගොඩනැගිලි පිළිගත් ක්‍රමවේදයකට ඉදිරියේදී තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත.

(ඈ) ඉදිරියේදී පාඨමාලා ගාස්තු අදාල කාලපරිච්ඡේදයට අනුව ගිණුම්ගත කිරීමට දිස්ත්‍රික් හා ජාතික පුහුණු මධ්‍යස්ථාන වලට දැනුම් දී ඇත. ඉදිරියේදී ඒ අනුව කටයුතු කරනු ඇත.

(ඉ) කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන පසුව එම සේවකයන් ස්ථීර කිරීම් වලදී පත්වීම් දිනය ලෙස සේවය ස්ථීර කරන ලද දිනය ගැනීම නිසා මෙම ගැටව සිදුවී ඇති අතර මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

(ඊ) ස්ථාවර තැම්පත් පොලී ආදායම් උපචිත පදනම මත ගිණුම් තැබීමට කටයුතු කරනු ඇත.

(උ) ඉදිරියේදී මෙවැනි අලාභයන් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත.

(ඌ) මෙහි සඳහන් මුළු මුදල ස්ථාවර වත්කම් වලට වෙන් කරන ලද වියදම් නොවන අතර එහි ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් ද ඇතුළත්ව ඇත. ඒ අනුව ආධාරවල ස්වභාවය හඳුනාගෙන සුදුසු පරිදි 2024 වර්ෂයේ ගිණුම් වලට ඇතුළත් කිරීමට කටයුතු කරමි.

(ඩ) උපදේශක දීමනා වෙනුවෙන් 2023 වර්ෂයේ ලැබී තිබූ මුලු මුදල රු. 107,323,495.00 කි. අතපසු වීමකින් 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 දිනට ලැබුණු 9,845,065.00 ක මුදලද 2023 වර්ෂයේ ලැබීමක් ලෙස සටහන් වීමෙන් මෙම වෙනස සිදුවී ඇත. නිපුණතා සිසු සවිය, අමාත්‍යංශ සහ SFIG ආයතන වලින් ලැබීම් පිළිවෙලින් 158,066,003.00 හා 1,724,690 සහ 6,944,593.00 ක මුදල නිවැරදි අතර, 2023 වර්ෂයේ තුල වියදම් වූ මුදල පමණක් වියදම් යටතේ ගිණුම්ගත කර අතර ඉතිරි මුදල සියල්ල ගෙවිය යුතු ලෙස පෙන්නුම් කර ඇත.

(ඒ) පොදු ව්‍යාපාර කාරක සභාව විසින් මාස 03 තුළ මෙම සංයුක්ත සැළැස්ම සකස් කර ඉදිරිපත් කරන ලෙස නියෝග ලබා දී තිබූ බැවින් මෙම අභියෝගාත්මක කාර්යය සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් පමණක් ඉටු කර ගත හැකි කාර්යයක් නොවන බැවින් එම අංශය ප්‍රධාන කොට ආයතනයේ සමස්ත කාර්යය මණ්ඩලය නියෝජනය වන කුලකයක් තෝරා ගෙන සකස් කල යුතු කටයුත්තක් විය. එවැනි කණ්ඩායමක් අදාල ඉලක්කය කරා මෙහෙයවා ගැනීම හා කෙටිකාලක් තුල නව සංයුක්ත සැලැස්මක් සකස් කිරීම සඳහා මනා පලපුරුද්දක් ඇති බාහිර පාර්ශවයක මාර්ගෝපදේශනය ලබා ගත යුතු විය. එමෙන්ම බාහිර පාර්ශවයක් මඟින් ලබා දෙන නව අදහස්, එක් රාමුවකට කොටු නොවූ යෝජනා විවිධ ආයතන හා කටයුතු කර ලබා ගන්නා අත්දැකීම් වඩාත් ප්‍රායෝගික සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය විය. එමඟින් ආයතන තුල සිටින නිලධාරීන් දැනුම ආකල්ප හා කුසලතාවයන් වඩා ප්‍රශස්ත මට්ටමින් ලබා ගැනීම තුළින් සංයුක්ත සැළැස්ම සකස් කිරීම සිදු කර ඇත.

මෙම සංයුක්ත සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් ලද රු. මිලියනයක මුදල අමාත්‍යාංශයෙන් ලැබුණු අතර, එම මුදල උපදේශක ආයතනයට ගෙවා තිබුණි. නමුත් මෙය ගිණුම්ගත කිරීමේදී වැරදීමකින් ලැබීම් හා ගෙවීම් එකම ගිණුමක සටහන් වී ඇත.

2.3

(අ) අදාළ සියළුම පාඨමාලා වල ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. ඊට අමතරව පරිපාලන හේතූන් මත සිදු වී ඇති අඩුපාඩු හෝ වෙනස්වීම් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ආ) මෙම ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ස්ථායීතාවය පරීක්ෂා කර ගොඩනැඟිල්ල භාවිතයට ගැනීම සඳහා කළ යුතු ප්‍රතිකර්ම ඇතුළත් තත්ව වාර්තාවක් ලබා දීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) වෙත කරන ලද ඉල්ලීම අනුව එම ආයතනය මේ වන විටත් මෙම ගොඩනැගිල්ල මුලිකව පරීක්ෂා කර ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක කොටස් සඳහා කළයුතු පරීක්ෂාවන් පිළිබඳව වාර්තාවක් ලබා දී ඇත. එම පරීක්ෂාවන් ඉටු කිරීම සඳහා මේ වන විට අවශ්‍ය කටයුතු කරමින් පවති. එම පරීක්ෂාවන් කර ලබා දෙන නිර්දේශයන් පරිදි මෙම ගොඩනැගිල්ල ව්‍යුහාත්මකව ස්ථායී තත්වයට පත්කිරීම සඳහා අවශ්‍ය වේ නම් ඒ සඳහා පියවර ගනු ලබන අතර ඉන්පසු ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) මෙම වාහන නඩත්තු ඒකකය ආයතනයේ කාර්යසාධනය සඳහා ඵලදායී ලෙස දායක වී තිබුණද එහි පරිපාලන කටයුතු සහ අධීක්ෂණ කටයුතු සඳහා යෙදවීමට සුදුසු නිලධාරී මඩුල්ලකගේ සහභාගීත්වයක් නොවුණි. එබැවින් මෙම ඒකකය තවදුරටත් අවිධිමත් ක්‍රියාපටිපාටියක් යටතේ පවත්වා ගෙන යෑම මූල්‍ය හා පරිපාලන ගැටළු රාශියකට මඟපෙන්වීමක් විය හැකි බැවින් තාවකාලිකව වසා දමන ලදී.

(ඈ) කුච්චවේලි හොටෙල් පාසල ආරම්භ කරන අවස්ථාවේ ස්ථිර ජල සැපයුමක් නොමැති බව හඳුනාගෙන තිබූ අතර ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය මඟින් ස්ථිර ජල සැපයුමක් ලබා දෙන තෙක් බවුසර් මඟින් මධ්‍යස්ථානයට අවශ්‍ය ජල පහසුකම් ලබා දීමේ එකඟතාවය මත මෙම මධ්‍යස්ථානය ආරම්භ කර ඇත. තවද උතුරු නැගෙනහිර යුද තත්වය අවසානයේදී එම ප්‍රදේශයන්හි පවතින ආධුනික පුහුණු ඉල්ලුම සලකාබලා මෙම මධ්‍යස්ථානය ආරම්භ කලත්, සුදුසු කම් ලත් උපදේශක වරයෙකු බඳවා ගැනීමේ හා රඳවා ගැනීමේ අපහසුතාවය මත මෙම තත්වය උද්ගතවී තිබුණි.

(ඉ) **හම්බන්තොට - හේනකඩුව**

මෙම ඉඩම යාබදව ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ආධුනිකයින් සඳහා බාහිර ක්‍රියාකාරකම් සහ දෛනික ක්‍රියාකාරම් සඳහා ඵලදායීව යොදා ගෙන ඇත.

මේ වන විට නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ මෙහෙයුම් අවසන්ව ඇති බැවින් ඉදිරියෙදි ප්‍රතිපාදන ලැබීම අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ සැලසුම් කරමින් පවතින කර්මාන්තපුරය ඉලක්ක කරමින් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නව ගොඩනැගිල්ලක් සැකසීමට කටයුතු සිදු කරනු ඇත.

පානදුර මෝදරවිල

පානදුර මෝදරවිල නව මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අදාළ සැළසුම් සකස් කර ආංශික නිපුනතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මුදල් ප්‍රතිපාදන වෙන්කළ අතර 2020 වන විට එහි සියළුම ප්‍රසම්පාදන කටයුතු එම ව්‍යාපෘතිය මඟින් අවසන් කර තිබුණද එම වසරේ පැවති වසංගත තත්වය හේතුවෙන් එය ප්‍රමාද වූ අතර ඉන් පසු ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුල මෙය අවසන් කළ නොහැකි බැවින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකරන ලදී. 2021 වසරේ අධිකාරිය විසින් ප්‍රාග්ධන වියදම් යටතේ ප්‍රතිපාදන ඉල්ලූම් කලද ඒ සඳහා එය වෙන් කර ලබා දී නොමැත.

(ඊ) මෙහි දක්වා ඇති රු.මි. 38.9 න් රු.මි. 27ක් 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනෙහි මෝටර් කාර්මික පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරි වූ කොටසයි. එම මුදල ඉතිරි වීමට ප්‍රධාන හේතුව වූයේ කොවිඩ් 19 වසංගත තත්වය හා භාණ්ඩ ආනයනය සීමා වීම හේතුවෙන් මෙම පුහුණු උපකරණ මිල දී ගැනීමට බාධා ඇති වීමෙන්ය. නමුත් මේ වන විට මෙම රු.මි. 27 ට අදාළ භාණ්ඩ ඇණවුම්පත් නිකුත් කර ඇති අතර ඉදිරියේදී මෙම භාණ්ඩ මිල දී ගෙන ගෙවීම් කිරීමේ හැකියාව පවතී. ඉතිරි මුදල පෙර වර්ෂයේ ව්‍යාපෘති මඟින් හා අමාත්‍යාංශයෙන් ලද මුදල් වන අතර මෙම වර්ෂයේදී එම මුදල් වැය කරනු ඇත.

(උ) 2024.02.29 දින පැවති 261 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණය පරිදි ඵඕ ෂදකාසබට සමාගම ඈවර කිරීම සඳහා එම සමාගමේ ගිණුම් කටයුතු සිදු කළ S&A Consultants PVT Ltd වෙත දැනුම් දෙන ලෙසත් එම ආයතනයෙන් පිළිතුරක් නොලද හොත් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා ඈවර කිරීම් කටයුතු සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව සභාපතිතුමාගේ අත්සනින් යුතුව S&A Consultants PVT Ltd ආයතනය වෙත VTA Holding සමාගම ඈවර කිරීමට අදාළ ඉල්ලීම් ලිපිය යොමු කිරීමට කටයුතු කර ඇත.

(ඌ) ලැබිය යුතු පාඨමාලා ගාස්තුවලින් වසරකට වඩා පැරණි පාඨමාලා ගාස්තු 13 වසරක අඛන්ඩ අධ්‍යාපන වැඩසටහන් යටතේ පාඨමාලා හැදෑරූ ආධුනිකයින්ගෙන් ලැබිය යුතු මුදල් වන අතර එම මුදල් ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශය විකඟ වී ඇත. අනෙකුත් පාඨමාලා ගාස්තු බොහොමයක් මේ වන විට අය කර ගෙන ඇත.

(එ) මේ පිළිබඳ විස්තර ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කරමි.

(ඒ) 204.06.14 දින වන විට තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ දත්ත වලට අනුව (Dash Board) හි දත්ත අනුව Registration Expired - 22, Registration Valid - 193, renewal Apps to be Attended -15

ඉදිරියේදී තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ දත්ත වලට අනුව තොරතුරු ලබා දීමට කටයුතු කරමි.

මේජර් ජනරාල් ප්‍රියන්ත වීරසිංහ (විශ්‍රාමික) VSV, USP, ato, MISMM,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.